www.wsws.org ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

සසප/ ලෝසවෙඅ ගිම්හාන පාසල 2005

# තෙවැනි දේශනය: බෝල්ශේවික්වාදයේ සම්භවය හා “කල යුත්තේ කුමක් ද?”

**ඩේවිඩ් නෝත් විසිනි**

*2005 අගෝස්තු මස 14 වැනි දා සිට 20 වැනි දා දක්වා මිචිගන්හි ඇන් ආර්බර්හි දී පැවැත්වුනු සමාජවාදී සමානතා පක්ෂයේ/ලෝසවෙඅ ගිම්හාන පාසැලෙහි දී ලෝක සමාජවාදී වෙබ් අඩවියේ කර්තෘ මන්ඩල සභාපති ඩේවිඩ් නෝත් විසින් පවත්වනු ලැබූ " බෝල්ශේවික්වාදයේ සම්භවය හා "කල යුත්තේ කුමක් ද? " යන දේශනය යි මේ. මෙය පාසැලෙහි පැවැත්වුනු තෙවැනි දේශනය යි.*

## රුසියානු මාක්ස්වාදයේ මූලාරම්භයෝ

දේශපාලනික න්‍යාය පිලිබඳ කවර දිනෙක හෝ ලියැවුනු වඩාත් වැදගත්, ප්‍රගාඪ හා නිසැකවම විප්ලවවාදී වූ කෘතියක් වන ලෙනින්ගේ "කල යුත්තේ කුමක් ද? " විශ්ලේෂනය සඳහා අද දින මාගේ දේශනය කැප කෙරෙයි. මේ සා පරිමානයකින් වැරැදි අර්ථ කථනයන්ට ද, විකෘතිකිරීම්වලට ද බඳුන් වූ වෙනත් කෘතීන් වෙතොත් ඒ ඉතා අල්පයෙකි. ධනේශ්වර අධ්‍යාපන ආයතනයන්ට අරක් ගත් නිමක් නැති ලෙනින් විරෝධීන් -- (මේ ඇතැමෙක් 1991 වන තුරු ම ලෙනින්ගේ ගුන ගයන්නන් ලෙස පෙනී සිටියෝ වෙති) -- ට අනුව, විසි වන සියවසේ සෑම නපුරක ම නො වේ නම් ඉන් බොහොමයක උල්පත මෙම කෘතිය යි. මේ හෙලා දැකීම්වලට පිලිතුරු දීම මගේ බලාපොරොත්තුව යි. තව ද, 1902 දී සාර් රුසියාවේ දේශපාලන පසුබිම තුල ක්‍රියාත්මක වූ කුඩා සමාජවාදී ව්‍යාපාරයක් සඳහා ලියැවුනු මෙම කෘතිය; 21 වන සියවසේ මුල් දශකයේ සමාජවාදී ව්‍යාපාරයට ඒ සා සුවිශේෂ මට්ටමකින් න්‍යායිකව හා ප්‍රායෝගිකව අදාලවන්නේ කුමක් නිසා දැයි පැහැදිලි කිරීම ද, මගේ බලාපොරොත්තුව යි.

දහනව වන සියවසේ අවසාන තුනෙන් පංගුව තුල, ජර්මනියේ මාක්ස්වාදී ව්‍යාපාරයේ වර්ධනය ගැන කථා කරන විට එහි නැගීම නො නැවැත්වියහැකි හා කුනාටුවක ලක්ෂන පෙන්නුම් කල බව මම අවධාරනය කරමි. පුදුම එලවන තරමේ කෙටි කාල පරිච්ඡේදයක් තුල, කම්කරු පන්තියේ ජනතා සංවිධානය ලෙස ඉස්මතු වීමට සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය සමත් වූයේ ය. එය අත්පත් කර ගත් ජයග්‍රහනයන්, සැබෑ අරගලයෙන් හා පරිත්‍යාගයෙන් තොර ව නො දිනිය හැකිව තිබුනි. එහෙත්, ජර්මානු සමාජවාදීන් වැඩ කරමින් සිටි පරිසරය; අවම වසයෙන් කිව හොත් රුසියානු විප්ලවවාදීන්ට මුහුන පෑමට සිදු වූ තත්වය සමග සැසැඳීමේ දී; සාපේක්ෂව හිතකර එකක් වූ බව කෙනෙකුට නොවැලැක්විය හැකි පරිදි හැඟී යයි.

සනාථ කෙරී ඇති පරිදි ලෝකයේ බලගතු ම විප්ලවකාරී සමාජවාදී සංවිධානය රුසියාව තුලින් මතුවීම පැහැදිලි කිරීමේ ප්‍රයත්නයක යෙදෙමින් ලෙනින් පසු කලෙක මෙසේ ලිවී යඃ

රුසියාව "එක ම නිවැරදි විප්ලවවාදී න්‍යාය වන මාක්ස්වාදය අත්පත් කොට ගත්තේ, සැබැවින් ම වේදනා සහගතව හා අඩ සියවසක නො ඇසූ විරූ වධ වේදනාවන් හා පරිත්‍යාගයන් ද නො ඇසූ විරූ විප්ලවකාරී වීර්යය හා නො ඇදහිය හැකි ධීර ශක්තියෙන් ද කැපවීමෙන් ද යුතු ව සිදු කල ගවේශනයේ, අධ්‍යයනයේ, භාවිතය තුල පිරික්සීමේ, බලාපොරොත්තු කඩවීමේ, නිරවද්‍ය බව තහවුරු කර ගැනීමේ හා යුරෝපීය අත්දැකීම් සමග සසඳා බැලීමේ ක්‍රියාවලියක් තුලිනි."[1]

අධිරාජ්‍ය හමුදාවේ ඉහල නිලධාරීන් කන්ඩායමක් විසින් සාර් ඒකාධිපතිත්වය පෙරලා දැමීමේ අසාර්ථක ප්‍රයත්නයක් දූරූ 1825න් ආරම්භ වූයේ රුසියාව තුල ආත්ම පරිත්‍යාගයේ, අදූෂිත භාවයේ හා එඩිතර ආවේගශීලීත්වයේ සම්ප්‍රදායයකි. සාර් ඒකාධිපතිත්වයේ බිහිසුනු හා නින්දිත යථාර්ථය ද, සමාජ පසුගාමිත්වය මත එය දූරූ අධිකාරය ද පෙරලාදැමීම සඳහා වූ කුරුස යුද්ධයක මානය අත්කරගත් මෙම ප්‍රයත්නය යටින් පැවතියේ රුසියානු විප්ලවවාදී ව්‍යාපාරය ද, රුසියානු නවකථා හා සාහිත්‍ය විචාරයෙන් මතුව ආ රුසියානු බුද්ධිමතුන්ගේ අත්‍යසාමාන්‍ය සමාජ හා සංස්කෘතික ප්‍රපංචයේ පැනනැගීම යි.

තව මත් සමාජවාදියෙකු ලෙස ඔහු ගත කල වසරවල මැක්ස් ඊස්ට්මන් විසින් ලියන ලද "තරුන ට්‍රොට්ස්කි" නම් චරිතාපදානයෙහි එන එක් අපූර්ව ඡේදයක, රුසියානු විප්ලවවාදී පෞරුෂය මෙසේ විස්තර කෙරෙයිඃ

"රුසියානු විප්ලවය සාක්ෂාත් කිරීම සඳහා අපූර්ව මිනිසුන් හා ගැහැනුන්ගෙන් සමන්විත පරපුරක් බිහිව තිබින. ඔබ සංචාරය කරන රටේ කුමන හෝ දුරබැහැර පලාතක දී දුම්රිය මැදිරියක් තුල හෝ බස් රියක් තුල නිහඬ, දැඩි, කල්පනාකාරී මුහුනක් දකින්නට ලැබෙයි. සුදු වන් දාර්ශනික නලල් තලයකින් හා දුඹුරු පැහැ මුදු රැවුලකින් ද යුත් මැදිවියේ මිනිසෙක්. නැතහොත් තියුනු ව වක් වූ ඇහි බැමින් ද දැඩි මාතෘත්වය පලකරන මුව පෙදෙසකින් හෙබි වැඩිමහලු ස්ත්‍රියක් හෝ සමහර විට මැදි වයසේ පිරිමියෙකු ද එසේත් නැතහොත් තව මත් ආකර්ශනීය රූ සපුවකින් හෙබි, එහෙත් කාල තුවක්කුවක්

වෙත පිය නගා ඇතිවා සේ බර අඩි තබමින් පියමනින තරුනියක් ඔබ විමසා බලන්නේ නම් ඔබට සොයාගත හැක්කේ ඔවුන් 'පක්ෂයේ පැරනි ක්‍රියාකාරීන්' බව ය.

ත්‍රස්තවාදී ව්‍යාපාරයේ සම්ප්‍රදායෙන් හැදීවැඩුනු ආත්ම පරිත්‍යාගයේ හා විශ්වාසයේ තිරසාර හා උදාර උරුමයෙන් පෝෂනය වූ ලදරු වියේ දී මනුෂ්‍ය වර්ගයාට ආදරය කිරීමටත් හැඟීම්බර නො වී සිතීමටත්, තමාගේ ම ස්වාමියා වීමටත් සිය සමාගමය තුල මරනය පවත්නා බව පිලිගැනීමටත් උගන්වන ලද්දා වූ ත් මේ පරපුර, තුරුනු වියේ දී තවත් යමක් උගෙන සිටියහ. ඒ ප්‍රායෝගික ව සිතීමට යි. සිය අභිමතාර්ථයෙහි හා පිටුවාහලේ උදුනෙන් මොවුහු පන්නරය ලැබූහ. බොහෝ දුරට ඔවුන් වංශවතුන්ගෙන් පැවත ආ අතර වීරත්වය පිලිබඳව විශ්වාසය තැබිය හැකි තෝරාගත් ගැහැනුන් හා මිනිසුන්ගෙන් සැදුම් ලත් වට මේසයේ නයිට්වරුන් හෝ සමුරායිවරුන් වන් මොවුන්ගේ උදාරත්වයෙහි පේටන්ට් පත්‍ර අයත් වූයේ අතීතයට නොව අනාගතයට ය."[2]

රුසියානු විප්ලවවාදී ව්‍යාපාරය එහි මුල් අවධීන් තුල කම්කරු පන්තිය වෙත යොමු නො වූ අතර ඒ වෙනුවට එය නැඹුරු වූයේ ජනගහනයෙන් අති මහත් බහුතරය සැදුම් ලත් ගොවි ජනතාව වෙත ය. 1861 දී, ගොවීන් ප්‍රවේනි දාස භාවයෙන් විධිමත් ලෙස මුදා හැරීම පිලිබඳ දෙ වන ඇලෙක්සැන්ඩර් සාර්ගේ ප්‍රකාශය, රුසියානු අධිරාජ්‍යයේ සමාජ-දේශපාලන ව්‍යුහයේ පරස්පරයන් තීව්‍ර කිරීමට හේතු විය. 1870 දශකයේ දී තරුන ශිෂ්‍යයන්ගේ සැලැකිය යුතු ව්‍යාපාරයක පැන නැගීම දක්නට ලැබුනු අතර ගොවීන් අතරට ගිය මොවුන්, ගොවීන්ට අධ්‍යාපනය ලබා දීමට ද, ඔවුන් දැනුවත් සමාජ දේශපාලන ජීවිතය කරා ගෙන ඒමට ද ක්‍රියා කලේ ය. මෙම ව්‍යාපාරයන් තුලට ප්‍රධාන දේශපාලන බල පෑම ගෙන ආවේ ලැව්රොව් හා බකුනින් ප්‍රමුඛ අරාජකවාදයේ න්‍යායාචාර්යවරුන් වෙතිනි. එයින් ද, විශේෂයෙන් ම බකුනින්, ගොවි ජන නැගිටීමකින් රුසියාවේ විප්ලවවාදී පරිවර්තනයක් සිදු වෙතැයි අපේක්ෂා කලේ ය. ගොවි ජනතා වෙතින් පලවූ උදාසීනත්වය ද, රාජ්‍ය මර්දනය ද යන දෙකම එකතු වීමෙන් මෙම ව්‍යාපාරයේ අරගලය කුමන්ත්‍රනකාරී හා ත්‍රස්තවාදී විධික්‍රම උපයෝගී කර ගන්නා තැනට සේන්දු වූයේ ය. මෙ වන් ත්‍රස්තවාදී සංවිධාන අතර වැදගත් ම එක වූයේ, 'නරෝද්නායා වොල්යා' හෙවත් 'ජනතා අපේක්ෂාව' යි.

## ප්ලෙකනොව්ගේ දායකත්වය

රුසියාවේ මාක්ස්වාදී ව්‍යාපාරය සඳහා න්‍යායික හා දේශපාලනික පදනම් දමනු ලැබුනේ, ජනතාවාදයේ හා ත්‍රස්තවාදී නැඹුරුවේ බලවත් බලපෑමට එරෙහිව 1880 ගනන්වල දී ජී.වී. ප්ලෙකනොව් ගෙන ගිය අරගලය විසිනි. නව මාක්ස්වාදී ප්‍රවනතාවත්, ජනතාවාදීනුත් අතර භේදයේ අරටුව ලෙස පැවතියේ ඓතිහාසික ඉදිරි දර්ශන පිලිබඳ මතභේදයකිඃ එනම්, සමාජවාදය කරා රුසියාවේ මාවත වැටී ඇත්තේ ගොවි දේපල පිලිබඳ සාම්ප්‍රදායික සාමූහික (කොමියුන) රූපයන් සමාජවාදය සඳහා පදනම සපයන්නා වූ ගොවිජන විප්ලවයකින් ද එසේ නැත හොත්, සාර්වාදය පෙරලා දැමීම, ප්‍රජාතන්ත්‍රවාදී සමූහාන්ඩුවක් පිහිටුවීම සහ සමාජවාදයට පරිවර්තනය වීමේ ආරම්භය රුසියානු ධනපතිවාදයේ වර්ධනය සහ නවීන කාර්මික නිර්ධන පන්තිය බිහි වීම මත සිදු වේ ද යන්න යි.

කලක් ජනතාවාදී ව්‍යාපාරයේ ප්‍රධාන සාමාජිකයෙකුව සිටි ප්ලෙකනොව් ත්‍රස්තවාදයට සහ තීරක බලවේගය ගොවි ජනතාව වන්නේ ය යන ජනතාවාදී ගුනාංගීකරනයට එරෙහිව තර්ක කරද්දී ඔහු රුසියාව ධනපති මාදිලියේ වර්ධනයක් අත්පත් කොට ගනිමින් සිටින බවත් එම ක්‍රියාවලියෙහි නො වැලැක්විය හැකි ප්‍රතිඵලයක් ලෙස කාර්මික නිර්ධන පන්තියක් බිහි වන බවත් මෙම නව සමාජ පන්තිය අවශ්‍යයෙන් ම විප්ලවවාදී ලෙස ඒකාධිපතිත්වය පෙරලා දැමීමේත්, රුසියාව ප්‍රජාතාන්ත්‍රිකරනය කිරීමේත්, සියලු රදලවාදී දේශපාලන හා ආර්ථික සුන්බුන් අතු ගා දැමීමේත්, සමාජවාදය කරා පරිවර්තනය ඇරඹීමේත් තීරක බලවේගය වනු ඇති බවත් පෙන්වා දුන්නේ ය.

මාක්ස්ගේ අභාවය සිදු වූ 1883 වසරේ ප්ලෙකනොව් විසින් 'කම්කරු විමුක්තිය' කන්ඩායම (Emanicipation of Labour Group) පිහිටුවීම, බුද්ධිමය වසයෙන් පමනක් නො ව කායිකව ම දැක්වූ ධෛර්යයට අමතරව ඉමහත් දේශපාලන පෙරදැක්මකින් යුතුව ද සිදු කල ක්‍රියාවකි. තව ද, එදා රුසියානු ජනතාවාදීන්ට එරෙහිව ප්ලෙකනොව් ඉදිරිපත් කල තර්ක, පසු කලෙක රුසියානු සමාජ ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂයට පදනම සැපයූ ක්‍රියා මාර්ගික අත්තිවාරම තහවුරු කලේ ය. එපමනක් ද නො ව මුලු මහත් විසි වන සියවස පුරා මත්, ඉනික්බිතිව අද දක්වාත්, සමාජවාදී ව්‍යාපාරය පෙලනු ලැබූ පන්ති හැඩ ගැස්වීම් හා විප්ලවවාදී මූලෝපාය පිලිබඳ තීරනාත්මක ගැටලු-රාශියක් පෙරදැකීමට ප්ලෙකනොව් සමත් විය.

අද දිනයේ ප්‍රධාන කොට ම ප්ලෙකනොව් සිහිපත් කෙරෙන්නේ දෙවන ජාත්‍යන්තරය සමයේ (1889-1914) මාක්ස්වාදී දර්ශනවාදයෙහි අර්ථකථනයන් අතර වැදගත් ම අයෙකු ලෙස පමනි. (එ ද සාමාන්‍යයෙන් ප්‍රමානවත් අගය කිරීමකින් තොරව ය.) විශේෂයෙන් ම ප්ලෙකනොව්ගේ ලේඛන අතරින් වැඩි කොටස, ඔහු හේගල්ගේ ද අපෝහකවාදී විධික්‍රමයේ ද වැදගත්කම අගය කිරීමට අපොහොසත් වූ බැව් පවසන අයවලුන්ගේ නොසැලකිලිමත් හා කටුක විවේචනයන්ට පාත්‍ර වී ඇත. එබඳු ප්‍රලාප කියවන යමෙකුට කල හැක්කේ, 'ඒවා ලියන පුද්ගලයන් ප්ලෙකනොව්ගේ කෘතීන් හෙලා දැකීමට පෙර එම කෘතීන් අධ්‍යයනය කිරීමට යම් කාලයක් ගත කරත්වා' යැයි ප්‍රාර්ථනා කිරීම පමනකි. මාක්ස්වාදී දර්ශනය සමග ප්ලෙකනොව්ට පැවති බුද්ධිමය සම්බන්ධතාව පිලිබඳ කරුනුවලට පසු අවස්ථාවක යලි ප්‍රවිෂ්ට වීමට මම බලාපොරොත්තු වෙමි. එහෙත් අවංකව ම කිව හොත් මෙය, අපට දැනට වැය කල හැකි කාලයට වඩා වැඩි කාලයක් අවශ්‍ය කෙරෙන විෂයකි.

නොසැලකිල්ලට නො වේ නම් අවතක්සේරුවට සාමාන්‍යයෙන් පාත්‍ර වී ඇතිත විප්ලවවාදී මූලෝපාය විෂයෙහි ප්ලෙකනොව් විසින් කරන ලද තවත් සංග්‍රහයක් පිලිබඳව මේ අවස්ථාවේ දී අවධාරනය කරනු කැමැත්තෙමි. ඒ, සමාජවාදී විඥානය නිර්මානය කිරීමෙහි ලා තීරනාත්මක හා අත්‍යවශ්‍යක ගාමක බලයක් ලෙස, ධනේශ්වරයට එරෙහි තම ස්වාධීන දේශපාලන අරගලයේ වැදගත්කම ගැන නිර්ධන පන්තියේ විඥානය වර්ධනය විය යුතු ය යන අවධාරනය යි.

'කම්කරු විමුක්තිය' ව්‍යාපාරය පිහිටුවා වැඩි කලක් ගත වීමට පෙර ලියූ ඔහුගේ වැදගත් ම මුල් කෘතියක් වූ "සමාජවාදය හා නිර්ධන පන්ති අරගලය" නම් කෘතියෙහි දී ප්ලෙකනොව් කම්කරුවන් දේශපාලන අවශ්‍යතාවලින් තමන් දූෂනය නො කර ගත යුතු යැයි පවා පවසමින් දේශපාලනයේ වැදගත්කම ප්‍රතික්ෂේප කල රුසියානු අරාජකවාදීන්ගේ අදහස්වලට විරුද්ධ වූයේ ය. "දේශපාලන අධිකාරය අත්පත් කොට ගත් කිසිදු පන්තියකට, 'දේශපාලනය' සම්බන්ධයෙන් තමන් දැක්වූ උනන්දුව පිලිබඳව කනගාටු වීමට කිසිත් හේතුවක් කිසි දා තිබී නැත. ඊට ප්‍රතිපක්ෂව ... ඒ සෑම පන්තියක් ම සිය වර්ධනයේ උච්චස්ථානයට නැගුනේ, දේශපාලන අධිකාරය තමන් සතු කර ගැනීමෙන් පසුව පමනකි... දේශපාලන අරගලය වූ කලි සමාජ ප්‍රතිසංස්කරනයේ උපකරනයක් බවත්, එහි සඵලතාව ඓතිහාසිකව ඔප්පු වී ඇති බවත් අපි පිලිගත යුත්තෙමු."

එතැන් පටන් ප්ලෙකනොව්, පන්ති විඥානය වර්ධනය වීමේ ප්‍රධාන අවධීන් පිලිබඳව විමසා බලයි. ඒ පිලිබඳව කෙරෙන මතු දැක්වෙන දීර්ඝ උද්ධෘතය, එම ඡේදයෙහි ගැබ්ව පවත්නා නෛසර්ගික චිරස්ථායී ගුනය විසින් සාධාරනීකරනය කෙරෙයි.

"රාජ්‍යය තුල තමන් දරන ආර්ථික ස්ථානය හා දේශපාලන භූමිකාව ද අතර අන්තර්-සම්බන්ධය පීඩිත පන්තිය විසින් වටහා ගැනෙන්නේ ක්‍රමයෙනි. දිගු කලක් ගත වන තුරු, සිය ආර්ථික වගකීම් පවා මුලුමනින් හඳුනා ගැනීමට එය අසමත් වෙයි. එම පන්තියේ සාමාජිකයන් වන තනි පුද්ගලයන්, සිය දෛනික දිවි පෙවෙත ගැට ගසා ගැනීම උදෙසා දුෂ්කර අරගලයක යෙදෙන්නේ, තමන්ට හිමි කර දී ඇති කාලකන්නි ජීවන කොන්දේසි, සමාජ සංවිධානයේ කවර පාර්ශ්වයන් විසින් තමන් මත පටවන ලද දැයි පවා නො සිතමිනි. තමන් වෙත එල්ල කෙරෙන ප්‍රහාරයන් කොතැනින් එන්නේ ද, නැත හොත් අවසාන විග්‍රහයේ දී මෙම ප්‍රහාර එල්ල කොට ඇත්තේ කවරෙකු විසින් ද යනු නො විමසා ම ඔවුහු එම පහර වැලැක්වීමට යත්න දරති. තව මත් පන්ති විඥානය ඔවුන් තුල ඇති වී නැත. තනි තනි පීඩකයන්ට එරෙහි අරගලයේ දී ඔවුන්ට මග පෙන්වීමට චින්තනයක් නැත. පීඩිත පන්තියට තව මත් තමන් වෙනුවෙන් වූ පැවැත්මක් නැත. අනාගතයේ එය සමාජයේ දියුනුතම පන්තිය වීමට නියමිත නමුදු, තව මත් එය එසේ වීමට පටන් ගෙන නැත. පාලක පන්තියේ දැනුවත්ව සංවිධානය වූ බලයට මුහුන දී සිටින්නේ තනි හුදෙකලා පුද්ගලයන්ගේ හෝ හුදෙකලා පුද්ගල කන්ඩායම්වල හුදෙකලා ප්‍රයත්නයන් ය. උදාහරනයක් ලෙස අද වුව, එක් සුවිශේෂී අධි-සූරා කන්නෙකුට වෛර කරන, එහෙත් සූරා කන්නන්ගේ සමස්ත පන්තියට ම එරෙහිව සටන් කල යුතු බවට හෝ මිනිසා විසින් මිනිසා සූරා කනු ලැබීමේ ඉඩ ප්‍රස්තාව ම අහෝසි විය යුතුව ඇති බවට සංකාවක් වත් නොහඟින කම්කරුවකු අපට හමු වන්නේ ඉඳහිට නො වේ.

"කෙසේ වෙතත්, ටිකෙන් ටික, සාමාන්‍යයීකරනයේ ක්‍රියාවලිය බලපැවැත්වීමෙන්, පීඩිතයෝ පන්තියක් ලෙස තමන් දැනුවත් වීමට පටන් ගනිති. එහෙත් තම පන්තියේ පන්ති පිහිටීමෙහි සුවිශේෂත්වයන් පිලිබඳ ඔවුන්ගේ වැටහීම තව මත් බොහෝ දුරට ඒක-පාර්ශ්වික යඃ සමස්තයක් ලෙස සමාජ යන්ත්‍රනයේ ගාමක බලවේගයන් හා ඊට විභවය සපයන දුනු ඇටවුම් තව මත් ඔවුන්ගේ විමංසනාක්ෂියට හසු වී නැත. සූරා කන්නන්ගේ පන්තිය ඔවුන්ට පෙනී යන්නේ දේශපාලන සංවිධානයේ වරපටින් නොබැඳුනු එක් එක් තනි හාම්පුතුන්ගේ සරල එකතුවක් ලෙස ය. සිය වර්ධනයේ මෙම අවධියේ දී ... 'සමාජය' හා 'රාජ්‍යය' අතර පවත්නා සම්බන්ධය කුමක් දැයි... පීඩිතයන්ට තව මත් පැහැදිලි වැටහීමක් නැත. රාජ්‍ය බලය, පන්ති අතර සතුරුකම්වලට ඉහලින් පිහිටා ඇතැයි උපකල්පනය කෙරේ. එහි නියෝජිතයන් පරසතුරු පාර්ශ්වයන් සමගි කරන්නන් හා ස්වාභාවික විනිශ්චයකරුවන් ලෙස පෙනී යයි. පීඩිතයෝ ඔවුන් කෙරේ පූර්න විශ්වාසය තබති; ආධාර ඉල්ලා තමන් කරන ආයාචනය ඔවුන් විසින් නො තකා හැරුනු කල්හි අතිශය පුදුමයට ද පත් වෙති. උදාහරන ගැන දීර්ඝව කතා නො කොටත මෑතක දී ආර්ථික ක්ෂේත්‍රයේ ඉතා ශක්ති සම්පන්න අරගලයක් කල, එහෙත් තව මත් ධනපති දේශපාලන පක්ෂ අතරින් එකකට අයත්ව සිටීම තමන්ට කල හැක්කක් ලෙස සලකන බ්‍රිතාන්‍ය කම්කරුවන් විසින් ද, ප්‍රදර්ශනය කොට ඇත්තේ සිය සංකල්පවල මෙවන් වියවුලක් බව පමනක් අපි සටහන් කොට තබමු.

පීඩිත පන්තිය තමාට හිමි තැන ගැන ගැඹුරු වැටහීමක් ලබා ගන්නේ, ස්වකීය වර්ධනයේ ඊලඟ සහ අවසන් අවධියේ දී ය. සමාජය හා රාජ්‍යය අතර සම්බන්ධය ඔවුහු දැන් වටහා ගනිති. සූරා කන්නන් දමනය කර දෙන ලෙස, එම සූරා කෑමෙහි ම දේශපාලන අවයවයෙහි කොටස්කරුවන් වෙත තව දුරටත් ආයාචනය නො කෙරේ. රාජ්‍යය යනු අත්පත් කොට ගෙන ප්‍රතිසංස්කරනය කල හැකි බලකොටුවක් බවත්, සිය ආත්මාරක්ෂාව සඳහා එසේ කල යුතු ම බවත්, එය මග හැර යා නොහැකි බව හා එහි අපක්ෂපාතිත්වය කෙරේ විශ්වාසය නො තැබිය හැකි බවත්, එම පන්තිය දැන් වටහා ගනී. තමන් මත පමනක් විශ්වාසය තබමින්ත පීඩිතයෝ - ලෑංගේ පැවසූ පරිදි, සමාජ ස්වෝපකාරයේ වඩාත් වැදගත් රූපාකාරය වන -- 'දේශපාලනික ස්වෝපාකාරය,' වටහා ගැනීමට පටන් ගනිති. දැන්, ඔවුහු පවත්නා සමාජ සම්බන්ධතා වෙනස් කිරීම මගින් ද, තමන්ගේ ම වර්ධනය හා සුභසාධනය සඳහා උචිත සමාජ පද්ධතියක් පිහිටුවා ගැනීම මගින් ද තමන්ට ම උපකාර කර ගැනීම සඳහා දේශපාලන අධිකාරය දිනා ගැනීමට සටන් වදිති. මෙම දේශපාලන අධිකාරී බලය වහා

අත්පත් කර ගත හැක්කක් වන්නේ ද නො වේ. විරුද්ධවාදීන් තුල ඇති ප්‍රතිරෝධය පිලිබඳ සියලු අපේක්ෂා මැඩලමින්, බලවත් බලයක් බවට පත් වීමට ඔවුන් සමත් වන්නේ ක්‍රමයෙනි. දීර්ඝ කාලයක් ඔවුන් සටන් වදින්නේ සහන සඳහා පමනකිත ඉල්ලන්නේ ඉල්ලීම් ඉදිරිපත් කෙරෙන්නේ අධිකාරය වෙනුවෙන් නො ව, අනාගතයේ එම අධිකාරය දිනීම සඳහා වර්ධනය වීමේ හා පරිනත වීමේ ඉඩ ප්‍රස්තා සලසන ප්‍රතිසංස්කරන වෙනුවෙනිත තමන්ගේ හදිසිතම හා ආසන්නතම ඉල්ලීම් සන්තර්පනය කරන්නා වූ ද, දේශයේ සමාජ ජීවිතයෙහි සිය බලපෑම් පරාසය අල්ප වසයෙන් හෝ ප්‍රසාරනය කරන්නා වූ ද, ප්‍රතිසංස්කරන වෙනුවෙනි. තීරනාත්මක සටන සඳහා අත්‍යවශ්‍ය වන නොපසුබස්නා වීර්යය, සාහසික එඩිතර භාවය හා වර්ධනය පීඩිත පන්තිය විසින් අත්පත් කොට ගැනෙන්නේ, සතුරු භූමියෙහි වෙන් වෙන් කුඩා කැබලි සඳහා කෙරෙන මෙම අරගලයේ කටුක පාසල තුලින් ම පමනකි. එහෙත් එපරිද්දෙන් මෙම ගුනාංග අත්පත් කොට ගත් කල්හි, ඓතිහාසිකව මරනයට තීන්දු වූ පන්තියක් දෙස බලන ආකාරයට සිය සතුරන් දෙස බැලීමට ඊට හැකි යත සිය විජයග්‍රහනය පිලිබඳ අල්පමාත්‍ර හෝ සැකයක් ඇති කර ගැනීමට අවශ්‍ය නැත. විප්ලවය ලෙස හඳුන්වනු ලබන්නේ, දේශපාලන අරගලය බවට පත් වූ කල්හි පමනක් විද්‍යමාන වන්නා වූ විප්ලවවාදී පන්ති අරගලයේ දීර්ඝ නාටකයෙහි අවසන් ජවනිකාව යි.

"දැන් ගැටලුව වන්නේ මෙය යිඃ 'සමාජ ව්‍යුහය එහි ආර්ථික සබඳතා විසින් නිර්නය කෙරේ' ය යන කරුන මත පිහිටා කම්කරුවන් 'දේශපාලනයෙන්' ඉවත් කොට තැබීමට සමාජවාදීන් ක්‍රියා කරන්නේ නම් එය ඥානාන්විත ක්‍රියාවක් ද යන්න යි. සත්තකින් ම නැතඃ එසේ කල හොත් ඔවුහු, එමගින්, කම්කරුවන්ට සිය අරගලයේ උපස්තම්භය (ආධාරක රුඳවුම් ලක්ෂ්‍යය) අහිමි කරතිත සූරා කන්නන් විසින් ගොඩ නගා ඇති සමාජ සංවිධානය වෙත තම ප්‍රයත්නය සංකේන්ද්‍රනය කිරීමේ හා තම ප්‍රහාර ඒ වෙත එල්ල කිරීමේ අවකාශය ඔවුන්ට අහිමි කරති. ඒ වෙනුවට කම්කරුවන්ට සිදු වනු ඇත්තේ, සෑම විට ම රාජ්‍ය බලය තම පැත්තේ තබා ගෙන සිටින තනි තනි සූරා කන්නන්ට හෝ, වැඩි ම වුව හොත් එවැනි සූරා කන්නන්ගේ වෙන් වෙන් කන්ඩායම්වලට එරෙහිව ගරිල්ලා යුද්ධයක යෙදීමට ය."[3]

ප්ලෙකනොව් විසින් දියත් කෙරුනු අරගලය, තමන් සමාජවාදීන් ලෙස හඳුන්වා ගන්නා අයවලුන් සඳහා අත්‍යවශ්‍ය කාර්ය කොටසක් අර්ථදැක්වී ය. එනම්, කම්කරු පන්තියේ දේශපාලනික පන්ති විඥානය වර්ධනය කිරීම සඳහා ද, සමාජවාදී විප්ලවයේ නායකයා ලෙස එහි ඓතිහාසික භූමිකාව රඟ දැක්වීමට එය සූදානම් කිරීම සඳහා ද තම සියලු ප්‍රයත්නයන් ඒකාග්‍ර කිරීම යි. මෙම අර්ථදැක්වීමෙන් නිරායාසයෙන් ගම්‍ය වන්නේ, නිශ්චිත දේශපාලන වැඩ පිලිවෙලක පදනම මත මෙම පන්ති විඥානය පිබිදවීමට, වර්ධනය කිරීමට හා සංවිධානය කිරීමට ක්‍රියා කරන මෙවලම වසයෙන් පක්ෂයේ ඓතිහාසික වැදගත්කම යි.

ප්ලෙකනොව්ගේ ලේඛන විසින් ජනතාවාදීහු අර්බුදයට හෙලන ලදහ. 1880 ගනන්වල අග භාගය වන විටත ඊට යන්තම් දශකයකට ඉහත දී "ජනතාවගේ" අභිප්‍රායයෙන් පලා යන භ්‍රෂ්ටයකු ලෙස ඔවුන් විසින් හෙලා දකින ලද පුද්ගලයාගේ ප්‍රහාරයන් හමුවේ ඔවුහු පැහැදිලිව ම ආරක්ෂකවාදී වෙමින් සිටියෝ ය. ත්‍රස්තවාදයේ දේශපාලන බංකොලොත්කම වඩ වඩාත් පැහැදිලි වෙමින් පැවතිනි. ත්‍රස්තවාදයේ ඉලක්කය සාර්වාදී රාජ්‍යය බිය ගැන්වීම මගින්, වෙනස් ආකාරයකට කටයුතු කල යුතුව ඇති බව ඊට ඒත්තු ගැන්වීම බැව් පෙන්වා දෙමින් ප්ලෙකනොව් ද, දිනෙන් දින වැඩි වෙමින් පැවති මාක්ස්වාදීන්ගේ බලඇනිය ද, "බෝම්බ රැගත් ලිබරල්වාදීන්" ලෙස ත්‍රස්තවාදීන් නම් ගැන්වූහ. එම ලේබලය මීට ශතකයකට ඉහත දී තරමට ම අදට ද උචිත වන්නකි. තව ද, කම්කරු පන්තියේ විඥානය ඉහල නැංවීමට කෙරෙන දීර්ඝ කාලීන අරගලයක අවශ්‍යතාව නො තකා හරිමින්, ඒ වෙනුවට වීරෝදාර තනි පුද්ගලයන්ගේ පලි ගැනීමේ ප්‍රහාර මගින් මහජනයාට විදුලි කම්පන ලබා දීමට ක්‍රියා කිරීමෙන් සිදු වන්නේ ඔවුන් වියවුල් වීමත්, ඔවුන්ගේ දිරියබල සිඳීමත් පමනකැයි ප්ලෙකනොව් අවධාරනය කලේ ය.

## උල්යානොව් ලෙනින්ගේ ඉස්මතු වීම

ප්ලෙකනොව්ගේ පෙරටුගාමී කාර්ය භාරය 1880 ගනන්වල අග භාගයේ හා 1890 දශකයේ මුල් කාලයේ ද විප්ලවවාදී අරගලයට සම්ප්‍රාප්ත වූ තරුනයන් හා බුද්ධිමතුන් සමස්ත පරපුරක් කෙරෙහි ම බල පැවැත්වී ය. නගරයන්හි හා ග්‍රාමීය ප්‍රදේශයන්හි ද සිදුවූ සමාජ පරිවර්තනය වඩ වඩාත් ප්ලෙකනොව්ගේ විග්‍රහයන්ට අනුකූලව සිදු වෙත් ම එම විචාරයන් හි බලපෑම ද තව තවත් වැඩුනේ ය.

1890 ගනන්වල දී, දිනෙන් දින බලවත් වන කම්කරු පන්තියක් බිහි කරමින් කර්මාන්ත වර්ධනය වීමත් සමග, රුසියාව වේගවත් ආර්ථික වර්ධනයක් අත්පත් කර ගනිමින් සිටින බැව් වඩාත් පැහැදිලිව පෙනී යන්නට විය. දිවි පිදූ විප්ලවවාදී ත්‍රස්තවාදියෙකුගේ බාල සොහොයුරා වූ ව්ලැඩිමීර් ඉලීච් උල්යානොව් විප්ලවවාදී ව්‍යාපාරයට ඇතුලු වූයේ මෙම තතු යටතේ ය. ජනතාවාදී ව්‍යාපාරය පිලිබඳව ඔහු විසින් ලියන ලද ' "ජනතා මිතුරෝ" යනු කවරහු ද? ඔවුහු සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන් හා සටන් කරත් ද? ඒ කෙසේ ද? ' නම් අපූර්ව විචාරයත් සමග, 1893 වන විට ඔහු බලගතු න්‍යායාචාර්යවරයෙකු ලෙස කීර්තියට පාත්‍ර ව සිටියේ ය. 1890 ගනන්වල රුසියාවේ පැවැති සුවිශේෂ තත්වයන් පිලිබඳව ඔහුගේ පූර්ව නිශ්චිතයන් තිබිය දී වුව, චිරත්කාලීන අදාලත්වයක් මෙම විචාරයට හිමි කර දුන් එහි ඇතැම් ලක්ෂනයන් නිසා, එය විප්ලවවාදී කම්කරු ව්‍යාපාරයට දායාද කල ප්‍රමුඛ පෙලේ ප්‍රතිපදානයක් ලෙස සැලකේ.

උල්යානොව් ලෙනින් සිය කෘතියේ වැඩි කොටස කැප කලේ මිඛාලොව්ස්කිගේ, මනෝබද්ධ සමාජවිද්‍යාව ලෙස ඔහු විසින් නම් කෙරුනු දෙයට පහර දීමට ය. නරෝද්නික් (ජනතාවාදී) ව්‍යාපාරයේ දේශපාලනය, රුසියාවේ පැවැති සමාජ සම්බන්ධතා පිලිබඳ විද්‍යාත්මක අධ්‍යයනයක් මත

පදනම් වී නොමැති බැව් එ මගින් ඔහු පැහැදිලි කලේ ය. වෙළඳ භාණ්ඩ නිෂ්පාදනය ඉහල මට්ටමකට වර්ධනය වී තිබීම, මහා පරිමාන කර්මාන්ත බිහි වී ඒවායේ අයිතිය පුද්ගලයන් අතලොස්සකගේ අත සංකේන්ද්‍රනය වී තිබීම හා එම අතලොස්ස විසින් දේපල කිසිත් නැති කම්කරු ජනකායකගේ ශ්‍රම ශක්තිය මිල දී ගෙන සූරා කනු ලැබීම යන කරුනු සමග පොර බැදීම ඔවුන් (නරෝද්නිකයන්) විසින් ප්‍රතික්ෂේප කොට ඇති බව ලෙනින් පෙන්වා දුන්නේ ය. එහෙත්, -- ඔහුගේ ඊලඟ කෘතිය වූ 'රුසියාව තුල ධනවාදයේ නැගීම' හි තව දුර වර්ධනය කැරුනු මෙම ආර්ථික විග්‍රහයට ද වඩා වැදගත් දෙයක් මෙහි අඩංගුව තිබින. ඒ, නරෝද්නික් ව්‍යාපාරයේ පන්ති ස්වභාවය පිලිබඳ ලෙනින්ගේ ගුනාංගීකරනය යි. නරෝද්නිකයන් හරයෙන් සුලුධනපති ප්‍රජාතන්ත්‍රවාදීන් බවත්, ඔවුන්ගේ දර්ශනය තුලින් පිලිබිඹු වූයේ ගොවි ජනයාගේ සමාජ තත්වය බවත් ඔහු පැහැදිලි කලේ ය.

ප්‍රජාතාන්ත්‍රික ගැටලු -- එනම්, සාර්වාදී ආඥාදායකත්වය අහෝසි කිරීම, ග්‍රාමීය ප්‍රදේශයන්හි වැඩවසම් ක්‍රමයේ නෂ්ටාවශේෂ සිඳ බිඳ දැමීම හා ඉඩම් ජනසතු කිරීම හා සබැඳුනු ගැටලු -- පිලිබඳ ව දැඩි ලෙස අවධාරනය කරන අතර ම ප්‍රජාතන්ත්‍රවාදී හා සමාජවාදී ව්‍යාපාරයන් අතර ඇති වෙනස නොතකා හැරීම මූලධර්මාත්මක වරදක් බව පැවසීමෙහි දී ඔහු දැක්වූයේ ඊට නො අඩු උනන්දුවකි. නිර්ධන පන්තියේ පන්ති විඥානය වර්ධනය කිරීමෙහි ලා ප්‍රධාන බාධකය ලෙස පැවැතියේ, එම පන්තිය ආඥාදායකත්වයේ ධනපති හා සුලුධනපති විරුද්ධවාදීන් අත අතකොලුවක් බවට පත් කිරීමේ ප්‍රවනතාව යි.

මිඛායිලොව්ස්කිගේ දර්ශනයට එරෙහිව සිය මෘග ප්‍රහාරය තුල දී, සුලු ධනපති ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ ඊනියා "සමාජවාදය" හා නිර්ධන පන්තියේ සමාජවාදය ද අතර පොදු කිසිවක් නැති බව ඔප්පු කිරීමට ලෙනින් අධිශ්ඨානශීලී විය. සුලු ධනේශ්වර "සමාජවාදයේ" හොඳම පැති කඩ ප්‍රාග්ධනයේ බලගතු වර්ධනය ද බැංකු හා කර්මාන්තයන්හි මහා පුරුෂයින් තුල එහි සංකේන්ද්‍රනය ද හමුවේ එම පන්තියේ අපේක්ෂා භංගත්වය පිලිබිඹු කරයි. ධනවාදයේ වර්ධනය පිලිබඳ විද්‍යාත්මක හා ඓතිහාසික විශ්ලේෂනයක් සිදු කිරීමට සුලුධනපති සමාජවාදය අසමත් ය. මක්නිසාදයත්, තව දුරටත් නැගී එන පන්තියක් නොව අතීත අර්ථ ක්‍රමයක ඉතිරි වූ සුන් බුන් නියෝජනය කරන්නක් ලෙස තමන්ගේ ම බලාපොරොත්තු විරහිත තත්ත්වය එවන් විශ්ලේෂනයකින් හෙලි පෙහෙලි කෙරෙන හෙයිනි.

විප්ලවවාදී සමාජවාදී ව්‍යාපාරය සඳහා ලෙනින් උකහා ගත් ප්‍රධාන නිගමනය වූයේ, එය, කම්කරු ව්‍යාපාරය තුල සුලු ධනපති ප්‍රජාතන්ත්‍රවාදී චින්තනයේ බලපෑම්වලට එරෙහිව නිර්දය අරගලයක් දියත් කල යුතු බව ය. ප්‍රජාතන්ත්‍රවාදී ඉල්ලීම්වල නිසගයෙන් සමාජවාදී කිසිවක් අන්තර්ගත නොවන බවත්, ඒකාධිපතිත්වය අහෝසි කිරීම හා වැඩවසම් රදල වතු බිඳ හෙලීම එක් අතෙකින් ඓතිහාසිකව ප්‍රගතිශීලී වන නමුත් කම්කරු පන්තිය සූරා කනු ලැබීම අහෝසි කිරීම එයින් කිසිසේත් ම ගම්‍ය නොවන බවත් වටහා ගැනීමට කම්කරු ව්‍යාපාරයට උගැන්විය යුතු ය. ඇත්ත වසයෙන් ම මෙම ඉල්ලීම් දිනා ගැනීමේ ප්‍රතිඵලය නම් හුදෙක් ධනපති ක්‍රමයේ වර්ධනයට ඉඩ ප්‍රස්තා සැලසීම හා (එමගින්) වැටුප් ශ්‍රමය සූරා කෑම උත්සන්න වීම යි. ප්‍රජාතන්ත්‍රවාදී අරගලයට කම්කරු පන්තිය ආධාර නො කල යුතු බවක් මෙයින් අදහස් නො කෙරේ. ඊට ප්‍රතිබද්ධව, කම්කරු පන්තිය ප්‍රජාතන්ත්‍රවාදී අරගලයේ පෙරමුනෙහි ම සිටිය යුතු ය. එහෙත් කවර කොන්දේසි යටතේ වුව, එය ධනපතීන්ගේ හෝ සුලු ධනපතීන්ගේ ධජය යටතේ සිය අරගලය නොකරයි. ප්‍රජාතන්ත්‍රවාදය සඳහා අරගලය ඔවුන් විසින් කල යුත්තේ, ධනේශ්වරයට ම එරෙහිව කෙරෙන අරගලයට ඉඩකඩ සපයා ගැනීම සඳහා ය.

සාර්වාදයට එරෙහිව සටන් කිරීමේ නාමයෙන් කම්කරුවන් ස්වකීය ස්වාධීන පන්ති අරමුනු යටපත් කොට ගනිමින් හා (දේශපාලන) වැඩ පිලිවෙල සම්බන්ධ කරුනු නොතකා හරිමින්, රාජ්‍යයේ සියලු දේශපාලන විරුද්ධවාදීන් සමග සන්ධාන ගත විය යුතු යැ'යි යෝජනා කල "පූට්ටුකරුවන්" හා "සහාග පෙරකදෝරුවන්" ඔහු හෙලා දුටුවේ ය.

මාක්ස්වාදීන් ප්‍රජාතන්ත්‍රවාදී අරගලය පෙරට ගෙන යන්නේ ලිබරලුන්ට හා සුලු ධනපති ප්‍රජාතන්ත්‍රවාදීන්ට අනුගත වීමෙන් නොව, කම්කරුවන් විප්ලවවාදී සමාජවාදී වැඩ පිලිවෙලක් මත පදනම් වූ ඔවුන්ගේ ම ස්වාධීන දේශපාලන පක්ෂයක් තුලට සංවිධානය කිරීම මගිනි. රුසියානු ජනතාවාදයේ ස්වභාවය සංක්ෂිප්තව දක්වමින් ලෙනින් මෙසේ ලිවී යඃ

" 'ජනතා අපේක්ෂාවන්' පිලිබඳ මල් බර කථා විශ්වාස කිරීම ප්‍රතික්ෂේප කොට වඩාත් ගැඹුරට කැන බැලීමට ඔබ තැත් කල හොත්, ඔබ ගනුදෙනු කරමින් සිටින්නේ හිස සිට දෙපතුලට ම සුලුධනපති සංකල්පවාදීන් සමග බැව් ඔබට වැටහී යනු ඇත...."

තම කෘතිය නිගමන කරා ගෙන එමින් ලෙනින් අවධාරනය කලේ, කම්කරුවන් "තමන් පෙලන පද්ධතියේ දේශපාලන හා ආර්ථික ව්‍යුහය වටහා ගැනීමට, එම පද්ධතිය යටතේ පන්ති පසමිතුරුකම්වල අත්‍යවශ්‍යතාවය හා නො වැලැක්විය හැකි භාවය හඳුනා ගැනීමට...." හැකියවුන් බවට පත් කිරීමේ දිශාවට විප්ලවවාදී පක්ෂයේ කටයුතු මෙහෙයවිය යුතුව ඇති බව යි. "....එහි වැඩි දියුනු නියෝජිතයන් විද්‍යාත්මක සමාජවාදයේ අදහස් -- රුසියානු කම්කරුවාගේ ඓතිහාසික කාර්ය භාරය පිලිබඳ අදහස -- හදාරා නිපුනත්වයට පැමිනි කල් හි, එම අදහස් පුලුල්ව පැතිර ගිය කල් හි සහ වර්තමානයේ තන්හි තන්හි හුදෙකලාව සිදුවන කම්කරුවන්ගේ ආර්ථික සටන් දැනුවත් පන්ති අරගලය බවට පරිවර්තනය කිරීම සඳහා කම්කරුවන් අතරින් ස්ථායී සංවිධාන පිහිටුවා ගත් කල්හි -- එවිට, රුසියානු කම්කරුවා, සියලු ප්‍රජාතන්ත්‍රවාදී කොටස්වල හිස ලෙස නැගී සිටිමින්, සර්වබලධාරිත්වය පෙරලා දමා (සියලු රටවල නිර්ධනීන් හා එක පෙලට සිටින) රුසියානු නිර්ධන පන්තිය විජයග්‍රාහී කොමියුනිස්ට් විප්ලවය කරා

කෙලින්ම වැටී ඇති විවෘත දේශපාලන අරගලයේ මාර්ගය ඔස්සේ කැඳවා ගෙන යනු ඇත."

දැනටමත්, මෙම බීජාංකුර කෘතියෙහි දීත්, බොල්ශෙවික් පක්ෂය ගොඩනැගීමෙහි ලා පසු කලෙක මග පෙන්වීමට නියමිත වූ සංකල්ප ලෙනින් විසින් ඉදිරිපත් කෙරී ඇත. පක්ෂය පිලිබඳ හෝ කම්කරු පන්තියේ ස්වාධීන දේශපාලන සංවිධානය පිලිබඳ සංකල්ප, ලෙනින්ගේ සොයාගැනීම් නො වේ. එහෙත් එම සංකල්පයන්ට ඔහු අසමසම තීව්‍රතාවකින් යුත් දේශපාලන හා දාර්ශනික තිරසාර භාවයක් අත් කර දුන්නේ ය. කම්කරු පන්තිය දේශපාලනිකව සංවිධානය කිරීම වූ කලී, හුදෙක් ප්‍රායෝගික ස්වභාවයේ කාර්යයන් තුලින් පමනක් ඉටු කල හැක්කක් නො වේ. ධනපතියන් කම්කරු පන්තියට බලපෑම් කිරීමට ද ඔවුන් මත අධිකාරය පවත්වාගෙන යාමට ද, යොදා ගැනීමට තැත් කරන දාර්ශනික ආකෘතීන් සියල්ලට' එරෙහිව නිර්දය න්‍යායික හා දේශපාලනික අරගලයක යෙදීමට සිදු වේ. මෙය ලෙනින් හොඳින් ඒත්තු ගෙන සිටියේ ය. කම්කරු පන්තියේ දේශපාලන එකමුතුකම සඳහා, පිටස්තර පන්ති බලවේගවල අවශ්‍යතා පිලිබිඹු කරන සියලු න්‍යායන් හා වැඩ පිලිවෙලවලට එරෙහිව නො පසුබස්නා අරගලයක් කල යුත්තේ ය. තවත් ලෙසකින් කිවහොත්, කම්කරු පන්තියේ දේශපාලනික සමජාතීයභාවය දිනා ගත හැක්කේ ඉහල ම න්‍යායික දැනුවත්කමක පදනම මත පමනකි.

1900 දී, "අපේ ව්‍යාපාරයෙහි හදිසි කටයුතු" මැයෙන් යුත් ලේඛනයක ලෙනින් මෙසේ ලිවී යː

"සමාජ ප්‍රජාතන්ත්‍රවාදය යනු කම්කරු පන්ති ව්‍යාපාරයේ හා සමාජවාදයේ සුසංයෝගය යි. එහි අරමුන වනුයේ කම්කරු පන්ති ව්‍යාපාරයට එහි එක් එක් වෙන් වෙන් අවධීන්හි දී අක්‍රියව සේවය කිරීම නො ව; ව්‍යාපාරයේ අවශ්‍යතා සමස්තයක් ලෙස නියෝජනය කිරීමත් එම ව්‍යාපාරයට එහි අවසාන එල්ලය හා දේශපාලන අරමුනු පෙන්වා දීමත් එහි දේශපාලනික හා දාර්ශනික ස්වාධීනත්වය ආරක්ෂා කිරීමත් ය. සමාජ ප්‍රජාතන්ත්‍රවාදයෙන් හුදකලා වූ කල්හි, කම්කරු පන්ති ව්‍යාපාරය අල්පතර ද, නොවැලැක්විය හැකි පරිදි ධනේශ්වර ද වෙයි. හුදු ආර්ථික අරගලයෙහි පමනක් යෙදීමෙන් කම්කරු පන්තියට එහි දේශපාලන ස්වාධීනත්වය අහිමි වෙයි; එය අනෙකුත් පක්ෂවල වලිගය බවට පත්ව මතු දැක්වෙන ශ්‍රේෂ්ඨ මූලධර්මය පාවා දෙයිː "කම්කරු පන්තීන්හි විමුක්තිය අත්පත් කොට ගත යුත්තේ එම කම්කරු පන්තීන් විසින් ම ය." කම්කරු පන්ති ව්‍යාපාරය හා සමාජවාදය තනි තනිව ස්වකීය මාවත්වල ගමන් කල කාල පරිච්ඡේදයක් සෑම රටකට ම තිබී ඇත. ඒ සෑම රටකදී ම මෙම හුදෙකලා වීම සමාජවාදය ද කම්කරු පන්ති ව්‍යාපාරය ද යන දෙකම දුර්වල කිරීමට හේතු භූත විය. සෑම රටක දී ම, සමාජවාදය හා කම්කරු පන්ති ව්‍යාපාරය ද අතර සංයෝජනය පමනක් ම, ඒ දෙක ම සඳහා චිරත්කාලීන පදනමක් නිර්මානය කලේ ය."[4]

එසේ ලිවීමෙන් ලෙනින් ආරම්භ කලේ, රුසියානු සමාජ ප්‍රජාතන්ත්‍රය තුල ඉස්මතු වී තුබූ ආර්ථිකවාදය නම් නව ප්‍රවනතාවකට එරෙහි කටුක අරගලයකි. මෙම නව ප්‍රවනතාවෙහි පැවැත්ම බැඳී තිබුනේ ජර්මනියේ බර්න්ස්ටයිනියානු සංශෝධනවාදයේ වර්ධනයන් සමග ය. ආර්ථිකවාදීන්ගේ දේශපාලනයෙහි හරය වූයේ විප්ලවවාදී දේශපාලන අරගලය සුලු කොට තැකීම යි. ඒ වෙනුවට, 1890 ගනන්වල මැද භාගයේ පැවැති ස්වයං සිද්ධ කම්කරු පන්ති ව්‍යාපාරයට අනුව තමන් හැඩ ගසා ගනිමින් ආර්ථිකවාදීන් යෝජනා කලේ, සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරය ස්ට්‍රයික් අරගල හා කම්කරු පන්තියේ ආර්ථික අරගලයේ අනෙකුත් ආකාරයන්ගේ වර්ධනය කෙරේ සිය අවධානය සංකේන්ද්‍රනය කල යුතු බව යි. මෙම දෘෂ්ටිකෝනයෙන් නිතැතින් ම හැඟැවුනේ කම්කරු ව්‍යාපාරය සිය විප්ලවවාදී සමාජවාදී අරමුනු ප්‍රායෝගික ඉලක්කයන් ලෙස සැලකීම නවතා දැමිය යුතු බව යි. ආඥාදායකත්වයට එරෙහි දේශපාලන අරගලයේ තමා දරන ස්ථානය පිලිබඳ අභිමානය, ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ධනපති විපක්ෂයට පවරා දිය යුතු බව යි. ප්ලෙකනොව් හා ලෙනින් විසින් ප්‍රකාශ කොට තිබූ ස්වාධීන විප්ලවවාදී වැඩ පිලිවෙල, ධනපති සමාජ රාමුව තුල කම්කරු පන්තියේ ආර්ථික කොන්දේසි වැඩි දියුනු කිරීම අරමුනු කොට ගත් වෘත්තීය සමිති ක්‍රියාකාරිත්වයට සහය පිනිස අත් හැර දැමිය යුතු බව යි. නැත හොත්, ඊ.ඩී. කුස්කෝවා 1899 දී සිය කුප්‍රකට ක්‍රෙඩෝ කෘතියෙන් යෝජනා කල පරිදිː

''(ප්‍රතිවාදී මත) නො ඉවසනසුලු මාක්ස්වාදය, නිෂේධාත්මක මාක්ස්වාදය හා (සමාජයේ පන්ති බෙදීම පිලිබඳ වඩාත් දල සංකල්පයක් දරන) ප්‍රාථමික මාක්ස්වාදය ද, ප්‍රජාතන්ත්‍රවාදී මාක්ස්වාදයට ඉඩ දී ඉවත්වනු ඇත. ඒ සමග ම, තත්කාලීන සමාජය තුල පක්ෂය දරන සමාජයීය ස්ථානය ද තදබල ලෙස වෙනස් විය යුතුව ඇත. පක්ෂය විසින් සමාජය පිලිගනු ලැබෙනු ඇත; එහි පටු කෝපරේට්වාදී හා -- බොහෝ අවස්ථාවන් හි දී සිදු වන පරිදි -- නිකායවාදී අරමුනු, සමාජයීය අරමුනු ලෙස පුලුල් වනු ඇත. බලය ඇල්ලීමේ දෘඪ ප්‍රයත්නය, ශ්‍රමිකයන්ගේ පන්ති අයිතිවාසිකම් වඩාත් පරිපූර්න හා ඵලදායී ආකාරයකින් සුරැකීමේ අභිලාශයෙන් තත්කාලීන සමාජය ප්‍රජාතන්ත්‍රවාදයේ රේඛාවන් ඔස්සේ ප්‍රතිසංස්කරනය කිරීම සඳහා අවශ්‍ය වෙනස්කම් සඳහා වූ ආශාවක් බවට, පෙරැලෙනු ඇත."[5]

එ පමනක් නොව ක්‍රෙඩෝව මෙසේ ද පවසයිː ''කම්කරුවන්ගේ ස්වාධීන දේශපාලන පක්ෂයක් යනු පිටස්තර අරමුනු හා පිටස්තර ජයග්‍රහනයන් මුලින් උදුරා ගෙන'වුත් අපේ පසෙහි යලි පැල කිරීමේ ප්‍රතිඵලය විනා අනෙකක් නො වේ.''[6]

ආර්ථිකවාදයේ පැන නැගීම ජාත්‍යන්තර ප්‍රපංචයක කොටසක් වියː බටහිර යුරෝපයේ කම්කරු ව්‍යාපාරය තුල අධිකාරය උසුලන දේශපාලනික හා දාර්ශනික බලවේගය බවට මාක්ස්වාදය නැගීගත් තතු යටතේ, එම කම්කරු ව්‍යාපාරය තුල මාක්ස්වාදයට ධනේශ්වර විරුද්ධත්වයක් බවට පත් වූ ව්‍යාපාරයක් කම්කරු ව්‍යාපාරය තුල වර්ධනය වූයේ ය. වෙනත් වචනවලින් කිව හොත්, සංශෝධනවාදයේ වර්ධනය විසින් නියෝජනය කෙරුනේ, දැනට මත් මා විසින්

පැහැදිලි කර ඇති පරිදි, කම්කරු ව්‍යාපාරය තුල මාක්ස්වාදයේ බලපෑමෙහි ප්‍රසාරනයට ප්‍රති ක්‍රියා දක්වනු වස් හා ඊට යටින් වල කපනු වස් ධනේශ්වරයේ සුලු ධනපති චින්තකයන් විසින් දරන ලද ප්‍රයත්නයයි. 1899 වන විට, ප්‍රන්ස සමාජවාදී මිලරන්ඩ් ධනපති ආන්ඩුවට ඇතුලූ වූ කල්හි, සංශෝධනවාදයේ ඇඟැවුම් බොහෝ දුරට පැහැදිලි ව පෙනෙන්නට විය.

අවස්ථාවාදයේ පුපුරා යාම, ජාත්‍යන්තර සමාජ ප්‍රජාතන්ත්‍රය තුල අර්බුදයක් අවුලුවා ලීය. මා දනට ම සඳහන් කොට ඇති පරිදි, ඊට එරෙහිව මුලින් ම නැඟී සිටියේ ප්ලෙකනොව් ය. පසුව රෝසා ලක්සම්බර්ග්, "ප්‍රතිසංස්කරනය ද? විප්ලවය ද? " නම් වූ සිය අනගි පත්‍රිකාව මගින් එම අරගලයට දායක වූවා ය. ජර්මානු සමාජ ප්‍රජාතන්ත්‍රවාදීහු අදිමදි කරමින් කලහයට තල්ලු කරනු ලැබූහ. එහෙත් අවස්ථාවාදයට එරෙහි අරගලය රුසියාවේ දී, ලෙනින්ගේ නායකත්වය යටතේ අත් පත් කරගත් වර්ධනය හා සැසඳිය හැකි, ඒ සා පූර්න, වර්ධනයක් වෙනත් කොතැනක දී වත් අත්පත් කර නො ගත්තේ ය.

විසිවන සියවස ආරම්භයේ දී රුසියානු සමාජවාදී ව්‍යාපාරය ඒකාබද්ධ දේශපාලන සංවිධානයක් ලෙස නො පැවැත්තේ ය. තමන් සමාජවාදීන් මතු නො ව මාක්ස්වාදීන් ලෙස පවා හඳුන්වා ගත් නමුදු සිය දේශපාලන හා ප්‍රායෝගික වැඩ කටයුතු ප්‍රාදේශීය පදනමකින් හෝ කම්කරු පන්තිය තුල සුවිශේෂී වාර්ගික හෝ ආගමික කන්ඩායමක නියෝජිතයන් ලෙස පවත්වා ගෙන ගිය ප්‍රවනතාවන් හා කන්ඩායම් ගනනාවක් පැවතුනි. ජෙවිශ් බූන්ද් යනු මේ පසු කී වර්ගයේ ප්‍රසිද්ධතම සංවිධානය යි.

1890 දශකයේ දෙවන භාගයේ දී, රුසියානු කම්කරු ව්‍යාපාරය ශක්තියෙන් ආඪ්‍ය වන්නට වූ කල්හි, ක්‍රියාමාර්ගික හා සංවිධානාත්මක ඒකාබද්ධතාවයේ අවශ්‍යතාව සුපැහැදිලි හා හදිසි අවශ්‍යතාවක් බවට පත් විය. 1898 දී මින්ස්ක් හි දී සමස්ත රුසියානු සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ සමුලුවක් පැවැත්වීමට දරූ ප්‍රයත්නය පොලිස් මර්දනය හා නියෝජිතයන් අත් අඩංගුවට ගැනීම හේතුවෙන් අත් හැර දමන්නට සිදු විය. ඉනික්බිතිව එලැඹුනු කාල පරිච්ඡේදයේ දී, ආර්ථිකවාදී ප්‍රවනතාව ඉස්මතු වීම මගින් මනාව ප්‍රකාශයට පත් වූ, රුසියානු සමාජවාදී ව්‍යාපාරය තුල දිනෙන් දින වැඩෙමින් පැවති විසමජාතී ස්වභාවය විසින්, සම්මේලනයක් කැඳවීමේ සැලසුම් අවුල් කර දමන ලදී.

ප්ලෙකනොව් තවමත් රුසියානු සමාජවාදයේ සම්භාවනීය න්‍යායික නායකයා වුව ද , රුසියානු සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ ඒකාබද්ධ සම්මේලනයක් කැඳවීම සූදානම් කිරීමේ කටයුතුවල තීව්‍රතාවය මධ්‍යයේ, උල්යානොව් ලෙනින් ප්‍රමුඛයෙකු ලෙස ඉස්මතු ව ආවේ ය. ඔහුගේ බලපෑමේ පදනම වූයේ ඉස්ක්‍රා (ගිනිපුපුර) නම් වූ රුසියානු සමාජ ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂයේ නව දේශපාලන පුවත්පත ප්‍රකාශයට පත් කිරීමෙහි ලා ඔහු ඉටු කල නායකත්ව කාර්යභාරයයි. දේශපාලනය නිසා විදේශ ගතවූවන්ගේ ව්‍යාපාරය තුල ද, රුසියාව තුල ප්‍රායෝගික විප්ලවවාදී ක්‍රියාකාරිත්වයන් හි නිරතව හුන් මාක්ස්වාදීන් අතර ද ඉස්ක්‍රා ඉමහත් පිලිගැනීමකට පාත්‍ර වූයේ එම පුවත්පත නො වන්නට විසිරුනු ස්වභාවයකින් දිගට ම පැවතී යාමට ඉඩ තුබූ ව්‍යාපාරයකට එ මගින් න්‍යායික, දේශපාලනික හා සංවිධානාත්මක ඒකාබද්ධතාවය සැපැයුනු නිසා ය.

ඉස්ක්‍රා පුවත්පතේ මුල් කලාපය 1900 දෙසැම්බර් මස ප්‍රසිද්ධියට පත් විය. එහි මුල් පිටුවේ පල කෙරුනු ප්‍රධාන නිවේදනයක ලෙනින්, ''අපගේ ප්‍රධාන හා මූලික කටයුත්ත වනුයේ, කම්කරු පන්තියේ දේශපාලන ප්‍රවර්ධනයට හා දේශපාලනික සංවිධානයට ඉඩ ප්‍රස්තා සැලසීම" බැව් පැහැදිලි කලේ ය. "මෙම කටයුත්ත පසුබිමට තල්ලු කර දමන්නෝ ද සියලු සුවිශේෂ කටයුතු හා අරගලයේ නිශ්චිත විධි ක්‍රම මෙම කටයුත්තට යටත් කිරීම ප්‍රතික්ෂේප කරන්නෝ ද වැරැදි මාවත්වල ගමන් කරමින් සිටින අතර, ඔවුහු ව්‍යාපාරයට තද බල හානි සිදු කරති."

සියවසක ඇවෑමෙන් අද දවසේ පවත්නා තතු සමග පවා ඉතා සුවිශේෂී ආකාරයකින් ගැලැපෙන වචනවලින්, ලෙනින් "කම්කරුවන්ගේ ජීවිතවල සුවිශේෂ මොහොතවල දී, පමනක්, උත්සව අවස්ථාවන්හි දී පමනක්.... ඔවුන් 'දේශපාලනය'ට කැඳවීමේ සංග්‍රහය කිරීම නිවැරදි හා උචිත ක්‍රියා පටිපාටියකැයි සිතන්නවුන්" තද බල ලෙස විවේචනය කරයි. සටන්කාමී වෘත්තීය සමිතිවාදය හා ආර්ථික ඉල්ලීම් සඳහා අරගල කිරීම ද විසින්, කම්කරුපන්තියේ රැඩිකල් ක්‍රියාකාරීත්වයේ මුල සිට අග දක්වා සියල්ල නියෝජනය වෙතැයි සලකන ලද ආර්ථිකවාදීන් හම ගසමින් ලෙනින් තිර කොට පැවසුවේ, සමාජවාදීන් අබිමුව ඇති තීරනාත්මක කටයුත්ත වන්නේ කම්කරු පන්තියට දේශපාලනික අධ්‍යාපනය ලබා දීම හා එම පන්තියේ ස්වාධීන දේශපාලන පක්ෂය ගොඩනැඟීම බවයි. "ඉතිහාසයේ කිසිදු පන්තියක්, තමන්ගේ දේශපාලන නායකයන් -ව්‍යාපාරයක් සංවිධානය කොට එය මෙහෙයවීමට සමත් කැපීපෙනෙන නියෝජිතයන් -බිහි නොකොට බලය දිනාගෙන නැතැ"යි ලෙනින් ලිවී ය. නිගමන වසයෙන් යම් සංක්ෂිප්ත ආකාරයකින් ලෙනින් යෝජනා කලේ, ''අප පොරබදන ගැටලු අතරින් වඩාත් දෑවෙන සුලු ඒවා අතරට අයත් වන, සංවිධානය පිලිබඳ ගැටලු පිලිබඳ විමසීම සඳහා ඉදිරි කලාපවල දී ලිපි මාලාවක් වෙන් කල යුතු''[7] බව යි.

මෙම යෝජනාවේ ප්‍රතිඵලයක් ලෙස බිහි වූයේ විසි වන සියවසේ වඩාත් ම දීප්තිමත් වූ ද , බලගතු වූ ද, මතභේදයට තුඩු දෙන සුලු වූ ද දේශපාලන ලියවිල්ල විය හැකි ලේඛනය යි -ලෙනින්ගේ 'කල යුත්තේ කුමක් ද? ' කෘතිය යි.

විශේෂයෙන් ම 1917 බොල්ශෙවික් විප්ලවයෙන් ඉක්බිති ව එලැඹුනු කාල පරිච්ඡේදය තුල මෙම කෘතිය විසින් අවුලුවා ලන ලද කටුක මත භේද ගැන සලකා බලන කල, 1902 මුලින්ම ප්‍රකාශයට පත් කෙරුනු අවස්ථාවේ දී ප්‍රමුඛ රුසියානු සාමාජ ප්‍රජාතන්ත්‍රවාදීන් -- විශේෂයෙන් ම ප්ලෙකනොව් -- විසින් දේශපාලන කටයුතු හා සංවිධානය පිලිබඳ ගැටලු සමග බැඳුනු පක්ෂ ප්‍රතිපත්තිවල ප්‍රකාශනයක් ලෙස එය පිලිගනු ලැබීම සැබැවින්ම අපූර්ව දෙයකි. ඔහුන් විසින් මෙම

කෘතිය එසේ පිලිගැනීමෙහි දේශපාලනික වැදගත්කමක් ගැබ් වෙයි. මක්නිසාද යත්, ලෙනින්ගේ මෙම ලේඛනයට එරෙහි හෙලා දැකීම්වලින් බොහොමයක් විසින් උපකල්පනය කෙරී ඇත්තේ, සම්භාව්‍ය මාක්ස්වාදය මත පදනම් නොවූ කුමන්ත්‍රනකාරීත්වයේ හා ආඥාදායකත්වයේ මූල බීජයක්, 'කල යුත්තේ කුමක් ද? ' කෘතිය විසින් හඳුන්වා දී ඇති බව ය. මෙම විවේචන පිලිබඳව, උක්ත කෘතිය පිලිබඳ අපේ විචාරය තුල දී කථා කිරීමට අපි බලාපොරොත්තු වෙමු.

## කල යුත්තේ කුමක් ද?

ලෙනින්ගේ පොත් පිංච ආරම්භ කෙරෙන්නේ, එඩුවාඩ් බර්න්ස්ටයින්ගේ රුසියානු අනුගාමිකයින් එනම් ආර්ථිකවාදීන් විසින් මතු කර තුබූ "විවේචනයේ නිදහස" පිලිබඳ ඉල්ලීම විමසා බලමිනි. බැලූ බැල්මට කැපී පෙනෙනසුලු තරමට ප්‍රජාතන්ත්‍රවාදී හා ආකර්ශනීය වන මෙම සටන් පාඨය ඔහු ජාත්‍යන්තර සමාජ ප්‍රජාතන්ත්‍රවාදයේ විවිධ කොටස් අතර ඇවිල ගිය මතභේදයේ - එනම්, සම්මතධාරී මාක්ස්වාදයේ ආරක්ෂකයින් හා එම සම්මතධාරීත්වයට එරෙහිව ක්‍රමානුකූලව න්‍යායික හා දේශපාලනික ප්‍රහාර එල්ල කිරීමෙහි යෙදී සිටි සංශෝධනවාදීන් ද අතර මතභේදයේ - සන්දර්භය තුල බහා ලයි.

ප්‍රන්ස සමාජවාදියෙකු වූ ඇලෙක්සැන්ඩර් මිලරන්ඩ්, ජනාධිපති වල්ඩෙක් රූසෝගේ ආන්ඩුවට ඇතුලු වීම වූකලි, ජර්මානු සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ ක්‍රියාමාර්ගික පදනම් පිලිබඳ බර්න්ස්ටයින්ගේ න්‍යායික සංශෝධනයන්හි තාර්කික දේශපාලන ප්‍රකාශනය බැව් සටහන් කරමින් "'විවේචනයේ නිදහස' පිලිබඳ සටන් පාඨයෙහි අර්ථය සමාජ ප්‍රජාතන්ත්‍රවාදය තුල අවස්ථාවාදී ප්‍රවනතාවක් සඳහා නිදහස ද, සමාජ ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රතිසංස්කරනයේ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයක් බවට පරිවර්තනය කිරීමේ නිදහස, ධනේශ්වර සංකල්ප සහ මූලද්‍රව්‍යය සමාජවාදය තුලට හඳුන්වා දීමේ නිදහස" **[8]**බව ලෙනින් ප්‍රකාශ කරයි.

විවේචනය සඳහා සංශෝධනවාදීන්ට ඇති අයිතිය කිසිවෙකු ප්‍රතික්ෂේප නොකරන බව මෙම ඉල්ලීමට පිලිතුරු දෙමින් ලෙනින් පවසයි. එහෙත් ඔවුන්ගේ විවේචන ප්‍රතික්ෂේප කිරීමට හා විප්ලවවාදී සමාජ ප්‍රජාතන්ත්‍රය ප්‍රතිසංස්කරනවාදී ව්‍යාපාරයක් බවට පරිවර්තනය කිරීමේ ප්‍රයත්නයට එරෙහිව සටන් වැදීමට මාක්ස්වාදීන්ට ඊට නොඅඩු අයිතියක් ඇති බැව් ඔහු තරයේ කියා සිටියි.

රුසියාවේ ආර්ථිකවාදී ප්‍රවනතාවෙහි සම්භවය පිලිබඳව කෙටි විමසීමකින් පසු, න්‍යාය පිලිබඳ තීරනාත්මක ප්‍රශ්න කෙරෙහි එය පොදුවේ දක්වන නොසැලකිල්ල පිලිබඳව ලෙනින් සටහන් කරයි. ඔහු සඳහන් කරන්නේ ආර්ථිකවාදීන් "එතරම් පාරට්ටු කරන විවේචනයේ නිදහස මගින් අදහස් කරන්නේ, එක් න්‍යායක් වෙනුවට අනෙකක් ආදේශ කිරීම නොව;" "සමස්ත හා සැලකිල්ලට භාජනය වූ න්‍යායෙන් නිදහස් වීමකි; ඉන් අදහස් කෙරෙන්නේ "සාරසංග්‍රහවාදය සහ ප්‍රතිපත්ති විරහිත බව" **[9]** යන ක්‍රියාමාර්ගයන් දූසිමකට වඩා "සමාජවාදී ව්‍යාපාරයේ සැබෑ ප්‍රායෝගික ජයග්‍රහනයන්, වටනේ ය." යන මාක්ස්ගේ ප්‍රකාශය, මෙම න්‍යායික නොතැකීම සුජාතකරනය සඳහා එහි අන්තර්ගතයෙන් උගුලුවා සංශෝධනවාදීන් විසින් භාවිත කෙරෙන බව ලෙනින් නිරීක්ෂනය කරයි. "න්‍යායික වියවුල්භාවයේ කාල පරිච්ඡේදයක දී මෙම වචන පුනරුච්ඡාරනය කිරීම, අවමගුලක දී වැලපෙන්නන්ට 'ප්‍රීතිමත් සුභ දවසක් ප්‍රාර්ථනා කිරීම වැනි' යැයි ලෙනින් පිලිතුරු දෙයි. ඒ ආකාරයෙන්ම නිතරම කල නොහැකි බව ඉක්බිතිව ඔහු පෙන්වා දෙයි.

"විප්ලවීය න්‍යාය නොමැතිව විප්ලවීය ව්‍යාපාරයක් තිබිය නොහැකි ය. ඉතාමත් පටු ප්‍රායෝගික ක්‍රියාකාරීත්වයේ මෝහනයක් සමග අතිනත් ගෙන, අවස්ථාවාදයේ හැඩකාර දේශනා පැවැත්වීම කෙරෙන මෙවැනි කාලයක, මෙම අදහස කොතරම් අවධාරනය කලත් වැඩි නැත." **(10)** "වඩාත් වැඩිදියුනු න්‍යායෙන් මඟ පෙන්වනු ලබන පක්ෂය" පමනක් ම කම්කරු පන්තියට විප්ලවවාදී නායකත්වය සැපයීමට සමත් වනු ඇතැයි තර්ක කරන ලෙනින්, ෆ්‍රෙඩ්රික් එංගල්ස් විසින් "සමාජ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වන ශ්‍රේෂ්ඨ අරගලයේ ආකෘතීන් දෙකක් නොව තුනක් හඳුනාගත්" බව සිහිපත් කර දෙමින්, "අද අප අතර පවත්නා විලාසිතාව වී ඇති එම අරගලයේ දෙ ආකාර (දේශපාලන හා ආර්ථික) ආකෘතීන් මතු නොවේ. පලමු දෙක සමග සම තත්වයක න්‍යායික අරගලය තැබීමේ වැදගත්කම"එංගල්ස් තේරුම් ගෙන තිබූ බව ලෙනින් සිහිපත් කරයි. **(11)** එංගල්ස්ගේ ප්‍රකාශය ලෙනින් උපුටා දක්වයි: "එයට පෙර පැවැති ජර්මානු දර්ශනවාදය, විශේෂයෙන්ම හේගල්ගේ දර්ශනවාදය නොවන්නට එකම විද්‍යාත්මක සමාජවාදය වන ජර්මානු සමාජවාදය, කිසි දිනක බිහි නොවනු ඇත. එමෙන්ම, කම්කරුවන් අතර න්‍යාය පිලිබඳ සංවේදිතාවකින් තොරව මෙම විද්‍යාත්මක සමාජවාදය ඔවුන්ගේ මසට හා ලෙයට කෙදිනකවත් ඇතුලු නොවනු ඇත."**(12)**

"මහජනයාගේ සාංසිද්ධිකතාව (spontaneity) සහ සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ සවිඤ්ඤානකත්වය ලෙස "කල යුත්තේ කුමක් ද?" කෘතියේ දෙවන කොටස නම් කොට තිබේ. මෙය නිසැකව ම ලෙනින්ගේ පොත්පිංචේ වඩාත්ම වැදගත් කොටස වන අතර, නොවැලැක්විය හැකි පරිදි ම, වඩාත් නිර්දය ප්‍රහාරයන්ට හා විකෘති කිරීම්වලට ගොදුරු වූ කොටස ද වෙයි. මෙම කොටස තුල දී වැඩකරන ජනතාව කෙරෙහි පිලිකුල් සහගත වූත්, ඔවුන්ගේ අභිමතාර්ථයන් කෙරේ අවඥාපරවශ වූත්, ඔවුන්ගේ දෛනික අරගලයට සතුරු වූත්, පෞද්ගලික බලය කෙරේ ලොල් වූත් ඔහු සහ ඔහුගේ ශාප ලත් පක්ෂය අයෝමය මුෂ්ඨිත අත්තනෝමතික ආඥාදායකත්වය අව්‍යාජ රුසියානු කම්කරු පන්තිය මත පටවන දිනය ගැන පමනක්ම සිහින දකිමින් සිටින දඩබ්බර ප්‍රභුවාදියෙකු (elitist) ලෙස ලෙනින් තමා ම හෙලිදරව් කරන බව නිරතුරුව ම අපට කියා තිබේ. එබැවින් අප මෙම කොටස සුපරීක්ෂාකාරී ව විමසා බැලීම වටනේ ය.

ලෙනින් විසින් විශ්ලේෂනය කරන ලද වැදගත් ම කරුන වන්නේ, එක්පසෙකින් මාක්ස්වාදය හා විප්ලවවාදී

පක්ෂය ද අනෙක් පසින් කම්කරු පන්තියේ සාංසිද්ධික ව්‍යාපාරය හා එම ව්‍යාපාරයේ ගමන්මග තුල කම්කරුවන් අතර වර්ධනය වන සමාජයීය සවිඥ්ඥානක භාවයේ ආකෘතීන් අතර සම්බන්ධතාවේ ස්වභාවයයි. 1860 ගනන්වල හා 1870 ගනන්වල පන්ති ප්‍රතිවිරෝධතාවන්ගේ ප්‍රාරම්භක අවස්ථාවන්ගෙන් විද්‍යමාන වීම්වලින් පටන් ගෙන, රුසියානු කම්කරුවන් අතර සවිඥ්ඥානක භාවයේ රූපාකාරයන්හි පරිනාමය පිලිබඳ සලකා බලමින් ඔහු සිය විශ්ලේෂනය ආරම්භ කරයි.

කම්කරුවන් විසින් යන්ත්‍රසූත්‍ර කඩා බිඳ දැමීමේ සිදුවීම් හා බැඳුනු මෙම අරගල, අතිශයින්ම ප්‍රාථමික ස්වභාවයේ ඒවා විය. තම කැරැල්ලේ සමාජ හා පන්ති ස්වභාවය පිලිබඳ අවබෝධයකින් තොරව, අපේක්ෂා භංගත්වය විසින් එලවනු ලැබූ මෙම සාංසිද්ධික නැගී සිටීම මගින් පන්ති විඥ්ඥානය ප්‍රකට කෙරුනේ එහි "කලල" රූපයෙන් පමනකි. ඉන් දශක තුනකට පසු වර්ධනය වූ තත්වය කැපී පෙනෙන ලෙස වඩාත් උසස් මට්ටමක පැවතියේ ය. කලින් පැවති අරගල සමග සැසඳීමේ දී, 1890 ගනන්වල පැවති වැඩ වර්ජන, කම්කරුවන් අතර සවිඥ්ඥානක භාවයේ කැපීපෙනෙන සුලු ඉහල මට්ටමක් ප්‍රකට කලේ ය. මෙම වර්ජන වඩාත් සංවිධිත ඒවා විය. ඉදිරිපත් වූ ඉල්ලීම් පවා වඩාත් සවිස්තරාත්මක විය. එතෙකුදු වුවත් කම්කරුවන් විසින් මෙම අරගලයන්හි ලා ප්‍රදර්ශනය කරන ලද්දේ, සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ස්වභාවයේ විඥ්ඥානයකට වඩා වෘත්තීය සමිතිවාදී විඥ්ඥානයකි. එනම්, මෙම වර්ජන දේශපාලනික ස්වභාවයේ ඉල්ලීම් මතු නො කලේ ය; ඔවුන්ගේ ඉල්ලීම් කම්කරුවන් හා පවත්නා සමාජ-ආර්ථික හා දේශපාලන පර්යාය අතර පවතින ගැටුමේ ගැඹුරු හා සමනය නො කල හැකි ස්වභාවය පිලිබඳ අවබෝධයක් ද ප්‍රදර්ශනය නොකලේ ය. කම්කරුවන් ඒ වෙනුවට තැත් කලේ, පවත්නා සමාජ ක්‍රමයේ රාමුව තුල තමාගේ තත්වය වැඩි දියුනු කර ගැනීමට පමන ය.

මෙම සීමාව නොවැලැක්විය හැකි විය. මක් නිසාද යත්, කම්කරු පන්තියේ සාංසිද්ධික ව්‍යාපාරයට සමාජ ප්‍රජාතන්ත්‍රවාදී, එනම්, විප්ලවවාදී, විඥ්ඥානයක් "සාංසිද්ධව", තමා විසින් ම වර්ධනය කර ගැනීමේ හැකියාවක් නොවූ නිසා ය. බොහෝ හෙලා දැකීම්වලට පාත්‍ර වූ තර්කයක් ලෙනින් මතු කරන්නේ මෙතැන දී ය. ඔහු මෙසේ ලියයි:

"කම්කරුවන් තුල (නිසගයෙන්) සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී විඥ්ඥානය පිහිටා තිබිය නොහැකි වූ බව අපි පවසා ඇත්තෙමු. එය පිටතින් ඔවුන් වෙත ගෙන ආ යුතුව ඇත. සෑම රටකම ඉතිහාසය විසින් පෙන්නුම් කෙරෙන්නේ, කම්කරු පන්තියට හුදෙක් තමන්ගේම ප්‍රයත්නයන් මගින් වර්ධනය කර ගත හැක්කේ වෘත්තීය සමිති විඥ්ඥානය පමනක් බවයි; එනම්, වෘත්තීය සමිති තුල ඒකරාශී වීමේ හාම්පුතුන්ට එරෙහිව සටන් වැදීමේ සහ අත්‍යවශ්‍ය කම්කරු නීති ආදිය ආන්ඩුව ලවා පනවා ගැනීමට පරිශ්‍රම දැරීමේ අත්‍යවශ්‍යතාව පිලිබඳ ඒත්තු ගැනීම දක්වා වන සවිඥ්ඥානකත්වය යනාදිය යි. කෙසේ වෙතත් සමාජවාදයේ න්‍යාය වර්ධනය වූයේ දේපල හිමි පන්තීන්හි උගත් නියෝජිතයන් - බුද්ධිමතුන් විසින් විස්තාරනය කරන ලද්දා වූ දාර්ශනික, ඓතිහාසික හා ආර්ථික න්‍යායන් තුලිනි. නූතන සමාජවාදයේ නිර්මාතෘවරයන් වූ මාක්ස් හා එංගල්ස් ද, සිය සමාජ තත්වයෙන් ධනේශ්වර බුද්ධිමතුන්ගේ ගනයට අයත් වෙති. එපරිද්දෙන් ම, රුසියාව තුල සමාජ ප්‍රජාතන්ත්‍රවාදය පැන නැගුනේ ද, කම්කරු පන්ති ව්‍යාපාරයේ සාංසිද්ධික වර්ධනයට මුලුමනින්ම පාහේ ස්වාධීනව ය; එය පැන නැගුනේ, විප්ලවවාදී සමාජවාදී බුද්ධිමතුන් අතර චින්තනයේ වර්ධනයෙහි ස්වාභාවික හා නොවැලැක්විය හැකි ප්‍රතිඵලය ලෙස ය." **(13)**

මාක්ස්වාදය හා කම්කරු පන්තියේ සාංසිද්ධිකව වර්ධනය වන්නා වූ වෘත්තීය සමිතිවාදීන් - එනම්, ධනවාදී විඥ්ඥානය ද අතර සම්බන්ධය පිලිබඳ තමන්ගේ අර්ථකථනයට සහාය පිනිස කාල් කෞට්ස්කිගේ අනුමැතිය සටහන් සහිතව ලෙනින් ඔස්ට්‍රියානු සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ කෙටුම්පත් වැඩ පිලිවෙලින් උපුටා දක්වයි.

"ධනවාදයේ වැඩි වර්ධනය විසින් නිර්ධනීන් සංඛ්‍යාවෙන් ඉහල නංවන විට, නිර්ධන පන්තිය වඩවඩාත් ධනේශ්වර ක්‍රමයට එරෙහිව සටන් කිරීමට තල්ලු කෙරෙයි; ඊට අවශ්‍ය ශක්තිය ද ලබයි. සමාජවාදයේ අවශ්‍යතාවය හා එහි ශක්‍යතාව පිලිබඳව නිර්ධන පන්තිය සවිඥ්ඥානක වෙයි. මේ අයුරින් ගත් කල සමාජවාදී සවිඥ්ඥානකත්වය, නිර්ධන පන්ති අරගලයේ අත්‍යවශ්‍ය හා ඍජු ප්‍රතිඵලයක් ලෙස පෙනී යයි. එහෙත් මෙය සහමුලින්ම අසත්‍යය. ඇත්ත වසයෙන් ම, න්‍යායක් ලෙස ගත් කල සමාජවාදයේ මුල් පිහිටා ඇත්තේ ද, නිර්ධන පන්තියේ පන්ති අරගලයේ මුල් පිහිටා ඇති නූතන ආර්ථික සම්බන්ධතා තුල ම ය. පසු කී පන්ති අරගලය මෙන්ම සමාජවාදය ද ධනපති ක්‍රමය විසින් නිර්මිත දරිද්‍රතාවට හා මහජනතාවගේ දුක් පීඩාවන්ට එරෙහි අරගලයෙන් ඉස්මතු වෙයි. එහෙත් සමාජවාදය හා පන්ති අරගලය උරෙන් උර ගැටී නැගී සිටිනු විනා, එකක් අනෙකෙන් ඇති වන්නේ නැතः මේ එක එකක් ඇති වන්නේ වෙනස් කොන්දේසි යටතේ ය. නූතන සමාජවාදී විඥ්ඥානය පැන නැගිය හැක්කේ ප්‍රගාඪ විද්‍යාත්මක දැනුමක පදනම මත පමනකි. සත්තකින්ම නූතන ආර්ථික විද්‍යාව, (උදාහරනයක් ලෙස,) නූතන තාක්ෂනය තරමට ම සමාජවාදී නිෂ්පාදනය උදෙසා අවශ්‍ය කොන්දේසියක් වෙයි. එසේ කිරීම සඳහා කොතෙක් ආශා කල ද නිර්ධන පන්තියට මේ දෙකින් එකකුදු නිර්මානය නො කල හැකිය. මේ දෙක ම බිහි වනුයේ නූතන සමාජ ක්‍රියාවලියෙනි. විද්‍යාවේ වාහකය නිර්ධන පන්තිය නොව ධනේශ්වර බුද්ධිමතුන් ය. (කාල් කෞට්ස්කිගේ අවධාරනය) : නූතන සමාජවාදය උපත ලද්දේ මෙම සමාජ ස්ථරයේ තනි තනි සාමාජිකයන්ගේ මනස් තුල ය. බුද්ධිමය වසයෙන් වඩාත් දියුනු නිර්ධනීන් වෙත එය සන්නිවේදනය කෙරුනේ මෙම ධනේශ්වර බුද්ධිමතුන් විසිනි. එම වැඩිදියුනු නිර්ධනීහු, පවත්නා කොන්දේසි විසින් ඉඩ හල කල්හි, එය නිර්ධන පන්තියේ පන්ති අරගලය තුලට හඳුන්වා දුන්හ. එනයින්, සමාජවාදී විඥ්ඥානය යනු නිර්ධන පන්ති අරගලයට හඳුන්වා දෙනු ලැබූවක් (von Aussen Hineingretagenes) විනා, එතුලින් සාංසිද්ධිකව ජනනය වූවක් (arwuchsig) නො

වේ. ඒ අනුව පැරනි හේන්ෆෙල්ඩ් වැඩ පිළිවෙල ඉතා නිවැරදිව පැවසූයේ සමාජ ප්‍රජාතන්ත්‍රයේ කටයුත්ත වනුයේ (ධනපති ක්‍රමය තුල - පරිවර්තක) ස්වකීය තත්වය පිළිබඳ සවිඥ්ඥානක භාවයෙන් හා ස්වකීය අරමුනු පිළිබඳ සවිඥ්ඥානක භාවයෙන් නිර්ධන පන්තිය පුබුදුවා ලීම (වචනාර්ථයෙන් ම ගත් කලෘ නිර්ධන පන්තිය සංතෘප්ත කිරීම) බව යි. මෙම විඥ්ඥානය පන්ති අරගලය ඇතුලෙන්ම පැන නැගුනි නම්, එවන් අවශ්‍යතාවක් ඇති නො වේ." (**14**)

මෙම ඡේදයෙන් ලෙනින් පහත දැක්වෙන් නිගමන උකහා ගනීෘ

"කම්කරු ජනතාව විසින් ස්වකීය ව්‍යාපාරයේ ක්‍රියාකාරිත්වය තුල තමන්ගේ ම ස්වාධීන දෘෂ්ටිවාදයක් ගොඩනගාගැනීම ගැන කථාවක් තිබිය නොහැකි හෙයින්, තෝරා ගැනීමට ඇත්තේ එක්කෝ ධනේශ්වර දෘෂ්ටිවාදය; නැතහොත් සමාජවාදී දෘෂ්ටිවාදය පමනකි. (මිනිස් වර්ගයා විසින් තුන්වැනි දෘෂ්ටිවාදයක් නිර්මානය කොට නැති හෙයින් ද ඊටත් වඩා, පන්ති පසමිතුරුකම්වලින් ඉරී ගිය සමාජයක අපන්තික හෝ පන්තිවලට ඉහලින් පිහිටා සිටින දෘෂ්ටිවාදයක් කිසි විටෙකත් ඇති විය නො විය හැකි හෙයින් ද) මැද මාවතක් නැත. එනයින්, සමාජවාදී දෘෂ්ටිවාදය කවර ලෙසකින් හෝ ලඝු කොට තැකීම, *අංශු මාත්‍ර පමනකින් හෝ ඉන් ඉවතට හැරීම* යනු ධනේශ්වර දෘෂ්ටිවාදය ශක්තිමත් කිරීමකි. සාංසිද්ධිකතාව පිළිබඳ බෝහෝ කථාබහ ඇසේ. එහෙත් කම්කරු පන්ති ව්‍යාපාරයේ "සාංසිද්ධික" වර්ධනය මග පෙන්වන්නේ ධනපති දෘෂ්ටිවාදයට එය යටත් කිරීම කරා ය; ක්‍රෙඩෝ වැඩ පිළිවෙලේ රේඛා ඔස්සේ එහි වර්ධනය කරා ය. මක් නිසා ද යත්, සාංසිද්ධික කම්කරු පන්ති ව්‍යාපාරය යනු වෘත්තීය සමිතිවාදය යි. එය Nur – Gewerkschaftlerei යි. වෘත්තීය සමිතිවාදය යනු කම්කරුවන් ධනපති පන්තියේ දෘෂ්ටිවාදයේ වහලුන් බවට පත් කිරීමයි. එබැවින්, අපේ කාර්යය, සමාජ ප්‍රජාතන්ත්‍රයේ කාර්යය, වන්නේ සාංසිද්ධිකතාවයට විරුද්ධව සටන් වැදීම යි; කම්කරු පන්තිය, ඔවුන් ධනේශ්වරයේ පියාපත් යටතට කැඳවා ගෙන යන මෙම සාංසිද්ධික වෘත්තීය සමිතිවාදී ප්‍රයත්නයෙන් ඉවතට හැරවීම යි. ඔවුන් විප්ලවවාදී සමාජ ප්‍රජාතන්ත්‍රයේ පියාපත් යටතට ගෙන ඒම යි."**(15)**

## 'කල යුත්තේ කුමක්ද?' කෘතිය පිළිබඳ ධනපති විචාර

මෙම ඡේදයෙන් යලි යලිත් හෙලා දැක ඇත්තේ ඒවා බොල්ශෙවික්වාදයේ ආඥාදායකත්වය කරා වූ අනාගත පරිනාමයක විෂබීජ ගැබ් කොට ගත් බොල්ශෙවික් "ප්‍රභූ වාදයක්" සාරවත් ම අයුරින් ප්‍රකාශයට පත් කොට ඇති බව පවසමිනි. 'නපුරෙහි බිජුවට' නමින් හිටපු ට්‍රොට්ස්කිවාදියෙකු වන රොබින් බ්ලික් විසින් ලියන ලද කෘතියක, අප ඉහත දී උපුටා ගත් අවසාන වාක්‍යය (ලෙනින් "වෘත්තිය සමිතිවාදී ප්‍රයත්න ධනේශ්වරයේ අත්තටු යටතට පත් වීම" සම්බන්ධව ලියූ) පිළිබඳව මෙසේ සඳහන් කැරෙයිෘ "(එය) මාක්ස්වාදී 'ශාස්ත්‍රීය භාවය' ආරක්ෂා කිරීමෙහි ලා බෙහෙවින් උනන්දු වූවකු විසින් සාමාන්‍යයෙන් කරන ලදැයි සලකන කල්හි, ආන්තිකව ම අසාමාන්‍ය සූත්‍රගත කිරීමකි. සාහසික බවින් එය, ජර්මානු සමාජ ප්‍රජාතන්ත්‍රවාදී එඩුවාඩ් බර්න්ස්ටයින් විසින් මාක්ස්වාදයට ගෙන එන ලද කවර සංශෝධනයකට වුව නොසම නො වේ.... මාක්ස් හා එංගල්ස් කිසි විටෙක නොකල දෙයක් නම්, දේශපාලන 'ප්‍රභූවාදයේ' හා සංවිධානාත්මක ප්‍රයෝජ්‍යතාවාදය සඳහා සිතාමතා සැකසූ න්‍යාය ධර්මයක් බවට තම ලේඛන විස්තාරනය කිරීම යි.''

'කල යුත්තේ කුමක්ද?' කෘතිය පිළිබඳ ධනපති විචාර

මෙම ඡේදයෙන් යලි යලිත් හෙලා දැක ඇත්තේ ඒවා බොල්ශෙවික්වාදයේ ආඥාදායකත්වය කරා වූ අනාගත පරිනාමයක විෂබීජ ගැබ් කොට ගත් බොල්ශෙවික් ''ප්‍රභූ වාදයක්" සාරවත් ම අයුරින් ප්‍රකාශයට පත් කොට ඇති බව පවසමිනි. 'නපුරෙහි බිජුවට' නමින් හිටපු ට්‍රොට්ස්කිවාදියෙකු වන රොබින් බ්ලික් විසින් ලියන ලද කෘතියක, අප ඉහත දී උපුටා ගත් අවසාන වාක්‍යය (ලෙනින් ''වෘත්තිය සමිතිවාදී ප්‍රයත්න ධනේශ්වරයේ අත්තටු යටතට පත් වීම'' සම්බන්ධව ලියූ) පිළිබඳව මෙසේ සඳහන් කැරෙයිෘ ''(එය) මාක්ස්වාදී 'ශාස්ත්‍රීය භාවය' ආරක්ෂා කිරීමෙහි ලා බෙහෙවින් උනන්දු වූවකු විසින් සාමාන්‍යයෙන් කරන ලදැයි සලකන කල්හි, ආන්තිකව ම අසාමාන්‍ය සූත්‍රගත කිරීමකි. සාහසික බවින් එය, ජර්මානු සමාජ ප්‍රජාතන්ත්‍රවාදී එඩුවාඩ් බර්න්ස්ටයින් විසින් මාක්ස්වාදයට ගෙන එන ලද කවර සංශෝධනයකට වුව නොසම නො වේ.... මාක්ස් හා එංගල්ස් කිසි විටෙක නොකල දෙයක් නම්, දේශපාලන 'ප්‍රභූවාදයේ' හා සංවිධානාත්මක ප්‍රයෝජ්‍යතාවාදය සඳහා සිතාමතා සැකසූ න්‍යාය ධර්මයක් බවට තම ලේඛන විස්තාරනය කිරීම යි.''ඎ16%

විශ්වවිද්‍යාලයීය දාර්ශනිකයෙකු වූ ලෙසෙ(''*ක් කොලකොෆ්ස්කිගේ 'මාක්ස්වාදයේ ප්‍රධාන දහරා' නම් 1978 දී මුල්වරට පල කරන ලද වෙලුම් තුනකින් යුත් සුප්‍රකට කෘතියේ මෙම තර්කය වඩා සවිස්තරාත්මක ලෙස වර්ධනය කෙරී ඇත. කම්කරුවන්ගේ ස්වයංසිද්ධ ව්‍යාපාරය සමාජවාදී විඥානයක් වර්ධනය කර ගැනීමෙහි අසමත් බවටත්, එහෙයින් එහි පවතින්නේ ධනපති විඥානය බවටත් වන ලෙනින්ගේ අවධාරනය, ඔහු ''අලුත් කථාවක්'' ලෙස බැහැර කරයි. කොලකොෆ්ස්කිට අනුව ඊට ද වඩා කනස්සල්ලට හේතු වන්නේ, කම්කරු ව්‍යාපාරය සමාජවාදී පක්ෂයක් මගින් නොමෙහෙයවෙන කල්හි එය ධනේශ්වරවාදී ස්වභාවයක් අත් කර ගත යුතු ය යන නිගමනය යි. "මීට පරිශිෂ්ට වශයෙන් වන දෙවැනි නිගමනයක් වෙයිෘ කම්කරු පන්ති ව්‍යාපාරය එහි සැබෑ අරුතින් ගත් කල, - එනම්, විප්ලවවාදී දේශපාලන ව්‍යාපාරයක් - අර්ථ දක්වනු ලබන්නේ කම්කරුවන්ගේ ව්‍යාපාරයක් වීමෙන් නො ව, නිවැරදි දෘෂ්ටියක් - එනම්, අර්ථ දැක්වීමෙන් 'නිර්ධන පන්තික' වන මාක්ස්වාදී දෘෂ්ටිය - අත්පත් කොට ගෙන සිටීමෙනි. වෙනත් වචනවලින් කිව හොත්, විප්ලවවාදී පක්ෂයේ පන්ති ස්වභාවය අර්ථ දැක්වීමෙහි ලා එහි පන්ති සංයුතියෙහි ඇති වැදගැම්මක් නැත."[17]

තව දුරට ද, කොලකෞව්ස්කි නරුම වක්‍රෝක්තීන් යොදා ගනිමින්. "පොදුවේ නිර්ධන පන්තියේ අනුභූතික විඥානය එය පසුපසින් ලැගසිටින නමුත්, පක්ෂය, එම පන්තියේ 'ඓතිහාසික' අවශ්‍යතාව කුමක් ද හා ඕනෑ ම නිශ්චිත මොහොතක එහි යථානුභූත විඥානය විය යුතුව ඇත්තේ කුමක් ද යන්න දැන සිටිතැ"[18] යි සමච්චල් කරයි. කම්කරු ජනතාව තම වැඩ පිලිවෙලට නොඑකඟ වන හා එය වටහා ගැනීමට පවා අපොහොසත් වන නමුදු, එමගින් කම්කරු පන්තියේ අවශ්‍යතා ප්‍රකාශයට පත් වෙතැයි, කුඩා දේශපාලන පක්ෂයක් විසින් කෙරෙන හාස්‍යජනක උදම් ඇනීම හෙලිදරව් කෙරෙන මේ වර්ගයේ සටහන් අත්‍යන්ත ලෙස ම ප්‍රඥාවන්ත විය යුතු යැයි එහි කතුවරයා සිතා සිටියත්ත මේ වර්ගයේ තර්ක ප්‍රඥාවන්ත ලෙස පෙනී යන්නේ යමෙකු වඩාත් පරෙස්සමින් ඒවා පිලිබඳව සිතා බැලීමට කරදර නොවන තාක් පමනකි.

කොලකෞව්ස්කිගේ තර්කය නිවැරදි නම්, කම්කරු පන්තික වේවා ධනපති පන්තික වේවා, කවර දේශපාලන පක්ෂයකින් වුව කවර පලක් ද? අවසානයේ ගත් කල සියලු දේශපාලන පක්ෂයෝ ද, ඒවායේ නායකත්වයෝ ද, පුලුල් සමාජයීය ජන කොට්ඨාසයක නාමයෙන් කථා කරන හා එහි අවශ්‍යතා ප්‍රකාශයට පත් කරන බැව් නො පවසත් ද? ධනපති පන්තියේ ඉතිහාසයට යමෙක් එබී බැලුව හොත් පෙනී යන්නේ කුමක් ද? පන්තියක් ලෙස එහි අවශ්‍යතා හඳුනා ගැනීම, අර්ථ දැක්වීම හා ප්‍රකාශයට පත් කිරීම යම් දේශපාලන පක්ෂ විසින් කරන ලද ද, ඒවායේ නායකයන්ට, තමන්ගේ පන්තිය හෝ අඩු ම තරමින් එහි වැදගත් ම කොටස් හෝ තමන් සටන් කළ ඉදිරිදර්ශනයට හා වැඩ පිලිවෙලට දිනා ගන්නා තුරු කටයුතු කිරීමට සිදු වූයේ විපක්ෂයේ කුඩා සුලුතර කන්ඩායම් ලෙස යත ඇතැම් විට නීති විරෝධී තත්වයන් යටතේ ය.

පාරිශුද්ධතාවාදය එංගලන්තය තුල ඃඡමරසඒබසිප*, නැගී එන ධනේශ්වරයේ අධිකාරී ප්‍රවනතාව ලෙස ඉස්මතු වී, ක්‍රොම්වෙල්ගේ නායකත්වය යටතේ ස්ටුව(ර්)ට් රජ පෙලපත පෙරලා විප්ලවය ජය ගැනීමට පෙර, අඩසියවසක් ආගමික-දේශපාලනික ප්‍රවනතාවක් ලෙස පැවැතුනි. ඉන් වසර එකසිය පනහකට පසු, දේශපාලනීකරනය වූ රූසෝවාදීන්ගේ ජැකොබින් පක්ෂය, 1789 හා 1792 අතර ධනේශ්වරයේ හා සුලු ධනේශ්වරයේ කටුක අභ්‍යන්තර කාන්ඩමික අරගල තුලින් ඉස්මතු වී ප්‍රන්ස විප්ලවයේ නායකත්වයට පත් වූයේ ය. විප්ලවයට පෙර යුගයේ පටන් වර්තමානය දක්වා ඇමරිකානු ඉතිහාසය සැලකිල්ලට ගත්ත ද, මේ හා සැසඳෙන උදාහරන නොඅඩුව ඉදිරිපත් කල හැකි ය.

පන්තියක ''වෛෂයික'' අවශ්‍යතා ප්‍රකාශයට පත් කෙරෙන ප්‍රතිපත්තීන් - එනම්, එම පන්තියේ දේශපාලන, සමාජ හා ආර්ථික අවශ්‍යතා ඉහල තලයකට නැංවීම සඳහා ඇවැසි කොන්දේසි හඳුනා ගෙන වැඩ පිලිවෙලක් තුල ඒවා සංග්‍රහ කිරීම වශයෙන් ප්‍රකාශයට පත් වන ප්‍රතිපත්තීන් - එම පන්තියේ බහුතරයක් විසින් හෝ ඇතැම් විට සැලකිය යුතු තරමේ පිරිසක් විසින් පවා හෝ දෙන ලද මොහොතක නො හඳුනා ගැනීමට ඉඩ ඇත. ඉතිහාසය විසින් සැකයකට ඉඩ නො තබා ප්‍රදර්ශනය කොට ඇත්තේ, වහල් භාවය අහෝසි කිරීම, ඇමරිකානු ජාතික රාජ්‍යය තහවුරු කිරීමට හා ධනපති කර්මාන්ත සහ ආර්ථික වර්ධනයේ දැවැන්ත ත්වරනයක් ඇති කිරීමට ද හේතුභූත වූ බව ය. එතකුදු වුවත් වහල් භාවයට එරෙහි සටනේ දේශපාලනික පෙරටු බල ඇනිය වූ ඇබොලිෂනිස්ට්වරුන්ට, දකුන සමග යුද වැදීමට සිදු වෙතැයි බිය වූ හා ඊට එරෙහි වූ උතුරුදිග ප්‍රාන්තයන්හි ධනේශ්වරයේ බලගතු ප්‍රතිරෝධයට එරෙහිව දශක ගනනාවක් ඇදී ගිය කටුක අරගලයක් කිරීමට සිදු විය. සංඛ්‍යාවෙන් සුලු පිරිසක් වූ ඇබොලිෂනිස්ට්වරු, උතුරුදිග ව්‍යාපාරිකයන්ගේ, වෙලඳුන්ගේ, ගොවියන්ගේ හා මෙතැන දී නාගරික කම්කරුවන්ගේ ද අතිමහත් බහුතරයකට වඩා ඉතා හොඳින් ඇමරිකානු ජාතික රාජ්‍යයේ හා උතුරුදිග ධනේශ්වරවාදයේ දීර්ඝ කාලීන වර්ධනයට වඩාත් හිතකර වන්නේ කුමක් දැයි අවබෝධ කොට ගෙන සිටිය හ. ඇත්ත වශයෙන් ම, දහනව වන සියවසේ මුල් භාගයේ දී ඇබොලිෂනිස්ට්වරු සිය වැඩ පිලිවෙලවල් හා ක්‍රියාකාරිත්වය, එවන් නිශ්චිත පන්තිමය පද භාවිතයෙන් පැහැදිලි කිරීමට උත්සාහ නො කල බැව් සැබෑ ය. එහෙත්. ඔවුන් විසින්, නැගී එන උතුරුදිග ධනේශ්වරයේ වඩාත් ම දේශපාලනික දූරදර්ශී කොටස් විසින් වටහා ගැනුනු එම පන්තියේ අවශ්‍යතාවන්, තමන්ගේ කාලයට උචිත වූ භාෂාවකින් ප්‍රකාශයට පත් කරන ලදැයි යන සත්‍ය කරුන එමගින් යටපත් නො වේ.

ධනේශ්වරයේ වෛෂයික අවශ්‍යතා අර්ථ දක්වමින් ඒ වෙනුවෙන් එම පන්තියේම විශාල කොටස්වල විරුද්ධත්වය මධ්‍යයේ ඊට එරෙහිව දේශපාලන පක්ෂයක් සටන් වැදීමේ මෑත කාලීන උදාහරනයක් රූස්වෙල්ට් යටතේ ඩිමොක්‍රැටික් පක්ෂයෙන් පෙන්වා දිය හැකි ය. කම්කරු පන්තියට සැලකිය යුතු තරමේ සහන ද ඇතුලත් වන, බරපතල සමාජ ප්‍රතිසංස්කරනයකින් තොරව එක්සත් ජනපදයේ ධනවාදය රැක ගත නොහැකි බව ඒත්තු ගත් ඇමරිකානු ධනේශ්වරයේ - නිශ්චිතව ම සුලුතරයක් වූ - කන්ඩායම ඔහු නියෝජනය කලේ ය.

තවත් කරුනක් පෙන්වා දීමට ඉඩ දෙන්න. පාලන තන්ත්‍රයන් හි ප්‍රමුඛතමයෝ, සිය වෛෂයික අවශ්‍යතා හඳුනා ගැනීමට දේශපාලන විද්‍යාවේ, සමාජ විද්‍යාවේ, ආර්ථික විද්‍යාවේ, ජාත්‍යන්තර කටයුතු පිලිබඳ ආදි වශයෙන් විවිධ ක්ෂේත්‍රයන්හි විශේෂඥයන් ලක්ෂ සංඛ්‍යාත පිරිසකගේ සේවය ලබා ගනිති. මා විසින් පසුව පැහැදිලි කෙරෙන හේතුන් මත, සාමාන්‍ය ධනපතියෙකුට, එවන් සාමාන්‍ය කම්කරුවෙකුට වඩා තම සැබෑ අවශ්‍යතා ගැන වටහා ගැනීම පහසු ය. කෙසේ වුව ද, පාලක පන්තියේ ප්‍රතිපත්ති සංග්‍රහය යනු කිසි ලෙසකින් වත් හුදෙක් "සාමාන්‍ය" ඇමරිකානු ව්‍යාපාරිකයෙකුගේ හෝ "සාමාන්‍ය" කෝටිපති සමාගම් සමූහයක විධායකයෙකුගේ පවා, සිතුම්පැතුම්වල සෘජු පිලිබිඹුවක් විය නොහැකි ය.

සමාජවාදී පක්ෂය හා විඥානයේ වර්ධනය අතර සම්බන්ධය පිලිබඳ ලෙනින්ගේ සංකල්පවලට මාක්ස්වාදී

පදනමක් නැතැයි ප්‍රකාශ කිරීමේ දී කොලකෞස්කි, මාක්ස් හා එංගල්ස් මෙම විෂයය පිලිබඳව සැබවින් ම ලියූ දේ සරලව ම නො තකා හරී. 1844 දී ලියන ලද "ශුද්ධ වූ පවුල" කෘතියෙහි, සාමජවාදී වැඩ පිලිවෙල සංග්‍රහ කිරීමේ දී මාක්ස් හා එංගල්ස් මෙසේ පැහැදිලි කරති:

"එය ඒ හෝ මේ නිර්ධනයා හෝ වේවා සාකල්‍යයෙන් නිර්ධන පන්තිය ම වේවා. මේ මොහොතේ තම ඉලක්කය ලෙස සලකන්නේ කුමක් ද යන්න පිලිබඳ ප්‍රශ්නයක් නො වේ. එය, නිර්ධන පන්තිය යනු කුමක් ද සහ, නිර්ධන පන්තියේ එම පැවැත්මට අනුව ඓතිහාසිකව ඔවුන්ට කරන්නට සිදුව ඇත්තේ කුමක් ද යන්න පිලිබඳ ප්‍රශ්නයකි. එහි ඉලක්කය ද ඓතිහාසික ක්‍රියාකාරිත්වය, අද දින ධනේශ්වර සමාජයේ සමස්ත සංවිධානයේම හා තමන්ගේ ම ජීවන තතුවලම යෝධ සෙවනැල්ලෙන් එලිපිට ම හා නො වැලැක්විය හැකි පරිදි වැසී පවතී." [19]

'කල යුත්තේ කුමක් ද ?' කෘතියට පහර දෙන තවත් පොතක් ඉහත උපුටා දැක්වූ ඡේදය ම ගෙන හැර දක්වයි. එහෙත් ඒ කොලකෞස්කි මෙන් හුදෙක් ලෙනින් පමනක් අපකීර්තියට පත් කිරීමට නො වේ. බ්‍රිතාන්‍ය ඉතිහාසඥ නීල් හාර්ඩිංගේ ආස්ථානය වන්නේ ලෙනින් සැබවින් ම සම්භාව්‍ය මාක්ස්වාදියෙකු බව යි. 'කල යුත්තේ කුමක් ද ?' කෘතියෙහි ඉස්මතු කෙරෙන සංකල්ප පදනම් වන්නේ මාක්ස් විසින් ම ලියන ලද 'ශුද්ධ වූ පවුල' කෘතියෙහි ඇති දේ මත ය. එබැවින්, හාර්ඩිංට අනුව, "නිර්ධන පන්තිය සංවිධානයෙහි, ඔවුන්ගේ කම්කටොලු ප්‍රකාශයට පත් කිරීමෙහි හා ඔවුන්ගේ දේශපාලන අරගලයට නායකත්වය දීමෙහි ලා සමාජවාදී බුද්ධිමතුන්ට පවරා ඇති වරප්‍රසාදිත කාර්ය භාරය වූ කලි මාක්ස්වාදයේ ලෙනින්වාදී අපගමනයක් නො ව, සමස්තයක් ලෙස මාක්ස්වාදී උද්ධච්චකමට ම ප්‍රමුඛ වූ ලක්ෂනයකි. මාක්ස් (හා ඉන් පසු බිහි වූ සැම මාක්ස්වාදියෙකු මත්) විසින්, නිර්ධන පන්තියේ දීර්ඝ කාලීන අවශ්‍යතාවේ හා අරමුනු පිලිබඳව කවර හෝ නිර්ධනයෙකු හෝ නිර්ධනීන් කන්ඩායමක් සතු විය හැකි අවබෝධයට වඩා දුරවබෝධ දැනුමක් තමන් සතු වෙතැයි උපකල්පනය කල යුතුව තිබිනි."[20]

ලෙනින් විසින් මාක්ස් සංශෝධනය කෙරුනු බව කොලකෞස්කි පවසන අතර, හාර්ඩිං තිර කොට කියා සිටින්නේ ලෙනින්, මාක්ස් මත තමා පදනම් වී ගත් බව ය. 'කල යුත්තේ කුමක් ද ?' කෘතිය පිලිබඳ මේ දෙදෙනාගේ ම හෙලා දැකීම ගලා එන්නේ සමාජවාදී පන්ති විඥානය දේශපාලන පක්ෂයක් විසින් කම්කරු පන්තිය තුලට ගෙන ආ යුතු බවටත්, තමන්ගේ වැඩ පිලිවෙල කම්කරු පන්තියේ වෛෂයික අවශ්‍යතා නියෝජනය කරන බැවි ඕනෑ ම පක්ෂයකට කිව හැකි බවටත් එතුල කෙරෙන ප්‍රකාශ ප්‍රතික්ෂේප කිරීම තුලිනි. වෛෂයික සත්‍යය පිලිබඳ මාක්ස්වාදී ආස්ථානය ව්‍යුත්පන්න කෙරෙන්නේ විද්‍යාවේ ආභාසයෙනි. එනම්, ලෝකය, වෛෂයික අර්ථයෙන් ගත් කල, දැන ගත හැකි හා නීතීන්ගෙන් බැඳුනු එකක් බවටත්, ''ක්‍රමානුකූල, සාමාන්‍යයීකෘත (හෝ 'වෛෂයික') විද්‍යාත්මක ඥානයත ක්ෂනික අත්දැකීම් විසින් ලබා දෙනු ලබන 'මනෝ මූල' ඥානයට වඩා උසස් කොට සැලකිය යුතු බවට"ත් [21] වූ විශ්වාසයෙනි.

වෛෂයික සත්‍යය යනු, මහජන මතයේ සලුපටෙන් ව්‍යුත්පන්න කොට ගත් ප්‍රතිඵලවලින් පරිබාහිරව, ඇතැම් විට ඊට ප්‍රතිවිරුද්ධව පවා, සැලකිය යුත්තකැයි යන මාක්ස්වාදී සංකල්පයට හාර්ඩිං පහර දෙයි. හේ මෙසේ ලියයි:

"පක්ෂය පිලිබඳ එහි න්‍යායෙහි මූලික පදනම සම්බන්ධයෙන් ගත් කල, ලෙනින්වාදය යනු මුලුමනින් ම මාක්ස්වාදයේ දරුවෙකි. (මාක්ස්වාදය මෙන් ම) එය ද, තමා සතුව විශේෂ වර්ගයක ඥානයක් ඇතැයි යන කියමන මත ද, නිර්ධන පන්තියේ අභිප්‍රාය හුදෙක් කම්කරුවන් අතර කෙරෙන මත විමසීමකින් සොයා ගත නොහැකි ය යන උද්ධච්ච තර්කය මත ද පදනම් වෙයි." [22]

තත්කාලීන, හිටපු වාමාංශික විශ්වවිද්‍යාල උගතුන් විසින් ඒ සා ප්‍රේමයෙන් බඳනා ලද විලාසිතාකාරී පශ්චාත් නූතන වාදයේ - විද්‍යාත්මක ඥානය යනු හුදෙක්, එහි අන්තර්ගතයේ සාරභූත ගුනයට මුලුමනින් ම අසම්බන්ධිත හේතූන් මත, සංස්කෘතියෙන් අඩු සහායක් ලද සෙසු ප්‍රකාශන විධීන් අභිභවා තම කල්පිතයන් තහවුරු කිරීමට සමත් වූ "වරප්‍රසාදිත" අනුශාසනා ක්‍රමයක් පමනකැයි යලි අර්ථ දැක්වී ඇති ඒ පශ්චාත් නූතන වාදයේ - පාරිභාෂික වාංමාලාවලින් සන්නද්ධව හාර්ඩිං, මාක්ස් හා ලෙනින් යන දෙදෙනා ම දායක වූ "ඓතිහාසික සමීපතාව පිලිබඳ ඡායාත්මක ප්‍රකල්පිතය"ට පහර දෙයි. මේ කවර නම් ප්‍රකල්පිතයක් ද?

"සමාජ ප්‍රවර්ධනය පිලිබඳව කෙරෙන ගැඹුරු අධ්‍යයනයක් මගින් හෙලිපෙහෙලි කෙරෙන ඇතැම් පොදු ප්‍රවනතාවන් ඇති බවටත්, එම ප්‍රවනතාවන් තහවුරු කොට අධිකාරිත්වයට පත් කල කල්හි ඒවා මිනිසුන් යම් දෙන ලද ආකාරයන්ගෙන් ක්‍රියා කිරීම සඳහා දිවවීමෙහි සමත් බව එකී අධ්‍යයනයන්ගෙන් ම හෙලි වනු ඇති"[23] බවටත් වූ ප්‍රකල්පිතය යි.

## විද්‍යාව සමාජය හා කම්කරු පන්තිය

මෙය අප කැඳවා ගෙන එන්නේ, පක්ෂයේ කාර්ය භාරය පිලිබඳ ලෙනින්ගේ සංකල්පය පමනක් නො ව, සමස්ත මාක්ස්වාදී ව්‍යාපෘතියේ ම යටින් දිවෙන ප්‍රධාන න්‍යායික හා දාර්ශනික ප්‍රශ්නය කරා ය. හාර්ඩිං පවසන්නේ, කම්කරුවන්ගේ සමීප අත්දැකීම් පදනම් කොට ගෙන ඔවුන්ගේ මනසෙහි ජනනය වන ප්‍රත්‍යක්ෂ ඥානයට හා මතයන්ට, සමාජ ප්‍රවර්ධනයේ නියාමයන් තුලට කිඳා බැස ලබා ගත් අන්තර් ඥානයක පදනම මත වර්ධනය කෙරෙන දැනුමට වඩා නොඅඩු වලංගුතාවක් හා නීත්‍යානුකූල භාවයක් ඇති බව යි. එවිට කම්කරුවන්ට දේශපාලන පක්ෂයක් අවශ්‍ය නැත. කම්කරුවන්ට දේශපාලන පක්ෂයක් අවශ්‍ය වන්නේ, විද්‍යාවෙන් හෙලිපෙහෙලි කෙරෙන නියාම පාලිත ප්‍රවනතාවන් සමග ඔවුන්ගේ භාවිතය පෙල ගැස්වීමේ ප්‍රයත්නය සඳහා ය. මෙහි දී එක් කරුනක් පෙන්වා දීමට මට

ඉඩ දෙන්න. හාර්ඩිංගේ තර්ක මත පදනම් ව යමෙකුට, සකල විද්‍යාවන්හි පැවැත්ම මුලුමනින් ම අනවශ්‍ය යැයි ප්‍රතික්ෂේප කිරීමට ඉඩ සැලසේ. විද්‍යාව සිය කාර්යය ආරම්භ කරන්නේ, සමීප සංවේදනයන් සංජානනය කිරීම මගින් ප්‍රකට වන යථාර්ථය ද, විශ්ලේෂනයේ හා න්‍යායික වියුක්තිකරනයේ සංකීර්න වූ ද, දීර්ඝ වූ ද ක්‍රියා දාමය තුලින් විකසිත වන යථාර්ථය ද අතර වෙනසින් ය.

වෛෂයික සමාජ යථාර්ථයක් පවත්නා බැව් පිලිගන්නේ යැයි උපකල්පනය කරමින් -- (විශ්වවිද්‍යාලයීය බුද්ධිමතුන්ට නම් මෙය විශාල ප්‍රශ්නාර්ථයකි) -- අප මුහුන දෙන සාරභූත ප්‍රශ්නය මෙසේ දැක්විය හැකි යः

තනි තනි කම්කරුවෙකුට වේවා සමස්තයක් ලෙස කම්කරු පන්තියට වේවා තමන්ගේ සමීප අත්දැකීම්වල පදනම මත මෙම වෛෂයික යථාර්ථය වටහා ගත හැකි ද? මෙම ගැටලුව -- විශේෂයෙන් ම ඉන් වසර ගනනාවක ඇවෑමෙන් *භෞතිකවාදය හා අනුභූතිවාදී විචාරය* ලිවීමේ දී ලෙනින් විසින් සුවිශේෂී පරිමානයකින් අධ්‍යයනය කරන ලද්දකි. එම කෘතියේ ලෙනින් මෙසේ ලියයිः "කවර සංකීර්නත්වයකින් හෝ යුත් සියලු සමාජ ආකෘතීන් තුල -- සහ විශේෂයෙන් ම ධනපති සමාජ ආකෘතිය තුල -- වෙසෙන මනුෂ්‍යයෝ; ස්වකීය අන්තර් ක්‍රියාකාරිත්වය තුලින් කවර වර්ගයක සමාජ සම්බන්ධතා ගොඩ නැගෙන්නේ ද, ඒවා කවර නියාමයන්ට අනුකූලව වර්ධනය වන්නේ ද, ආදිය පිලිබඳව සවිඥානක නො වෙති. උදාහරනයක් ලෙස ගොවියෙක් සිය ධාන්‍ය විකිනීමේ දී ලෝක වෙලඳ පොලෙහි ලෝක පරිමාන ධාන්‍ය නිෂ්පාදකයන් සමග 'අන්තර් ක්‍රියාවලිය'කට ඇතුලු වෙයි. එහෙත් හේ ඒ බැව් නො දනියි. හුවමාරුවේ පදනම මත කවර වර්ගයක සමාජ සම්බන්ධතා ගොඩ නැගුනේ ද යන්න පිලිබඳ ව ද, ඔහු සවිඥානක නො වේ. සමාජ විඥානය සමාජ පැවැත්ම පිලිබිඹු කරයි -- ඒ මාක්ස්ගේ උගැන්වීම යි. පිලිබිඹුව පරාවර්තිතයෙහි (reflected) ආසන්න වසයෙන් සත්‍ය පිටපතක් විය හැකි ය; එහෙත් ඒවා එකිනෙක අනන්‍ය වෙතැයි පැවසීම අමනෝඥ ය."[24]

"... ලෝක ආර්ථික පද්ධතියෙහි සෑම තනි නිෂ්පාදකයෙක් ම, තමන් නිෂ්පාදන තාක්ෂනයට ඒ හෝ මේ වෙනස්කම හඳුන්වා දෙන බැව් වටහා ගනී; සෑම හිමිකරුවෙක් ම තමන් අන්‍යයන් සඳහා ඇතැම් නිෂ්පාදන හුවමාරු කරන බැව් වටහා ගනියි. එහෙත් මෙම නිෂ්පාදකයන් හා හිමිකරුවන් අවබෝධ කොට නො ගන්නේ එසේ කිරීමෙන් තමන් සමාජ පැවැත්ම වෙනස් කරන බව යි. ලෝක ධනපති ආර්ථිකය තුල ඔවුන්ගේ සියලු බෙදීම් ගැබ් කොට ගත් සියලු වෙනස්කම්වල ඓක්‍යය, මාක්ස්ලා හැත්තෑ දෙනෙකු විසින් වුව ග්‍රහනය කල නො හේ. වඩාත් ම වැදගත් දේ වන්නේ, මෙකී වෙනස්කම්වල ද ඒවායේ ඓතිහාසික වර්ධනයේ ද වෛෂයික තර්කනය එහි ප්‍රධාන හා මූලික අංගෝපාංග තුලින් හෙලිපෙහෙලි කර ගෙන තිබීම යි -- මෙහි දී වෛෂයික යන්න යෙදෙන්නේ සවිඥානක පැවැත්ම මිනිසාගේ පැවැත්මෙන් ස්වායත්ත ව, පැවතිය හැකි හා වර්ධනය විය හැකි ය යන අර්ථයෙන් (බොග්ඩනොව් සිය 'න්‍යාය' මගින් බර යොදා ඇත්තේ එබඳු සොච්චම් දේ කෙරේ ය) නො ව සමාජ පැවැත්ම මහජනතාවගේ සමාජ විඥානයෙන් ස්වායත්ත ය යන අරුතිනි. ඔබ ජීවත් ව ව්‍යාපාරයන්හි යෙදීම ද දරුවන් ලැබීම ද, භාන්ඩ නිෂ්පාදනය හා හුවමාරුව ද යන කාරනාව වෛෂයික ව අත්‍යවශ්‍ය ව වර්ධනයන් දාමයකට මුල පුරයි. එය ඔබේ සමාජ විඥානයෙන් ස්වායත්ත වන අතර, එකී විඥානය මගින් කිසි දිනෙක මුලුමනින් ග්‍රහනය කර නො ගන්නේ ය. මනුෂ්‍යත්වයේ ඉහල ම කර්තව්‍යය වන්නේ, ආර්ථික පරිනාමයේ (සමාජ ජීවිතයේ පරිනාමය) මෙම වෛෂයික තර්කනය යමෙකුගේ සමාජ විඥානයට ද, සියලු ධනේශ්වර රටවල වැඩි දියුනු පන්තීන්ගේ විඥානයට ද හැකි තාක් නිශ්චිත, පැහැදිලි හා තීරනාත්මක රටාවකට අනුයුක්ත කල හැකි පරිද්දෙන්ත එහි මූලිකාංගයන් තුලින් ග්‍රහනය කර ගැනීම යි."[25]

තමන්ගේ රැකියාව එහි අංශුමාත්‍ර අවයවයක් වන්නා වූ දැවැන්ත අන්තර් සම්බන්ධිත භූගෝලීය ආර්ථික ජාලයක් පිලිබඳ ව රැකියාවන්ට යන ජනයා කොතෙක් දුරට දැන සිටිත් ද? තමන්ගේ රැකියාව හෝ තමා සේවය කරන සමාගම හෝ සමග, නූතන ජාත්‍යන්තර නිෂ්පාදනයේත් භාන්ඩ හා සේවා හුවමාරුවේත්, අතිශය සංකීර්න ක්‍රියා දාමයන්ට ඇති සම්බන්ධතාව පිලිබඳ ව වඩාත් ම බුද්ධිමත් කම්කරුවාට වුව ඇත්තේ අතිශයින් ම නොපැහැදිලි අවබෝධයකැයි උපකල්පනය කිරීම අසාධාරන නො වේ. එමෙන් ම, අන්තර් ජාතික ධනේශ්වර මූල්‍ය අභිරහස් ද, වටිනාකම් ආරක්ෂා කිරීමේ භූගෝලීය අරමුදල්වල කාර්ය භාරය ද, ඩොලර් බිලියන දස ගුනයෙන් වටනා මූල්‍ය සම්පත් දිනපතා අන්තර් ජාතික දේශ සීමා හරහා එහා මෙහා වීමේ රහසිගත හා බොහෝ විට (ක්ෂේත්‍රයේ විශේෂඥයනට පවා) විනිවිද නො යා හැකි ආකාරයන් ද පිලිබඳ වටහා ගැනීමේ හැකියාවක් තනි කම්කරුවෙකුට නැත. නූතන ධනේශ්වර නිෂ්පාදනයේ, වානිජ්‍යයේ හා මූල්‍යයේ යථාර්ථයන් කොතරම් සංකීර්න ද යත්, සංගතයන්හි ප්‍රමුඛයෝ ද දේශපාලන නායකයෝ ද ඒ පිලිබඳ ප්‍රධාන අධ්‍යාපන ආයතනයන්හි විශ්ලේෂන හා උපදෙස් මත රැඳී සිටිති. තමන් හමුවේ ඇති දත්තවල අර්ථය කුමක් ද යන්න පිලිබඳ ව ඔවුන් විවිධ මත දරන අවස්ථාවන් ඇත්තේ ස්වල්පයක් නො වේ.

එහෙත් පන්ති විඥානය පිලිබඳ ගැටලුව වූ කලි, නූතන ආර්ථික ජීවිතයේ සංකීර්න ප්‍රපංචය හදාරා ග්‍රහනය කොට ගැනීමේ ද එහි ස්වාමිත්වයට පත් වීමෙහි ලා ඇත්තා වූ ද නිසැක දුෂ්කරතාවන්ට වඩා ඔබ්බට විහිද යන්නකි. වඩාත් මූලික හා සාරභූත තලයක දී, තනි කම්කරුවෙකු හා ඔහුගේ හාම්පුතා ද අතර සමාජ සම්බන්ධයේ නිශ්චිත ස්වභාවය සමස්ත කම්කරු පන්තිය හා ධනේශ්වරය අතර සම්බන්ධය පසෙක තිබිය ද, සංවේදන සංජානනයේ හා සමීප අත්දැකීම්වල මට්ටමෙන් ග්‍රහනය නොකෙරෙන්නේ හා නො කල හැකි ය.

තමන් සූරා කෑමට භාජන වන බැව් ඒත්තු ගත් කම්කරුවෙකුට වුව, තමාගේ ම කටුක පුද්ගලික අත්දැකීම්වල

පදනම මත, එම සූරා කෑමට යටින් පවත්නා සමාජ-ආර්ථික යන්ත්‍රනය සංජානනය නො කල හැකි ය. තව ද, සූරා කෑම පිලිබඳ සංකල්පය යනු පහසුවෙන් වටහා ගත හැක්කක් නො වේ. තමන්ට ප්‍රමානවත් ගෙවීමක් නො කෙරේ ය යන ඉවෙන් කෙලින් ම එම සූරා කෑම පිලිබඳ සංකල්පය ව්‍යුත්පන්න කර ගැනීම ගැන කියනුම කවරේ ද? රැකියාවක් සඳහා ඉල්ලුම් කරමින් අයැදුම් පතක් පුරවන කම්කරුවා තම ශ්‍රම ශක්තිය, විකිනීම සඳහා ඉදිරිපත් කරන බැව් සංජානනය නො කරයි; නැත හොත්, එම ශ්‍රම ශක්තියට පමනක් ආවේනික ගුනය වන්නේ එය මිල දී ගැනීම සඳහා ගෙවන මිලට (වැටුපට) වඩා වැඩි වටිනාකමක් උපදවීමට ඊට ඇති හැකියාව බැව් වටහා නො ගනියි. ලාභය ව්‍යුත්පන්න කෙරෙන්නේ ශ්‍රම ශක්තිය මිලට ගැනීමේ පිරිවැය හා එම ශ්‍රමය විසින් නිර්මානය කෙරෙන වටිනාකම ද අතර වෙනසින් බව නො හඟියි.

එමෙන් ම කම්කරුවෙක් යම් නිශ්චිත මුදලක් ගෙවා වෙලඳ භාන්ඩයක් මිලට ගන්නා විට, එම ගනුදෙනුව යනු සාරභූත වසයෙන් දේවල් අතර සම්බන්ධයක් (කබායක් හෝ වෙනත් වෙලඳ භාන්ඩයක්, යම් නිශ්චිත මුදලකට මිලට ගැනීම) නො ව මිනිසුන් අතර සම්බන්ධයකැයි යන අවබෝධය ද ඔහුට නැත. මුදලේ ස්වභාවය, රූපික වටිනාකමෙහි ප්‍රකාශනය ලෙස ඓතිහාසික ව එය පැන නැංගේ කෙසේ ද සහ නිෂ්පාදනයත් වෙලඳ භාන්ඩ හුවමාරුවත් විශ්වමය වූ සමාජයක යටින් දිවෙන ධනපති සමාජයේ සමාජ සබඳතා සඟවා ආවරනය කිරීමට එය ක්‍රියා කරන්නේ කෙසේ ද යන්න අවබෝධ කොට ගැනීමට ඔහු පැහැදිලි ව ම අසමත් ය.

මා මේ දැන් සාකච්ඡා කල දෑ, මාක්ස්ගේ වඩාත් ම වැදගත් කෘතිය වූ ප්‍රාග්ධනයේ (කැපිටාල්) න්‍යායික-ඥානවිභාගයික පදනම ලෙස සැලකිය හැකි දැයි පිලිබඳ පොදු හැඳින්වීමක් ලෙස සැලකිය හැකි ය. එහි ප්‍රථම වෙලුමෙහි, අතිශය වැදගත් පලමු පරිච්ඡේදයෙහි, අවසාන කොටසෙහි දී මාක්ස් වෙලඳ භාන්ඩ උද්දීපනය පිලිබඳ සිය න්‍යාය හඳුන්වා දෙයි. එහි දී, ධනපති සමාජය තුල සමාජ සම්බන්ධතා ගුඪකරනය වීමේ වෛෂයික මූලාශ්‍රය එනම්, මෙම සුවිශේෂී අර්ථ ක්‍රමය තුල මිනිසුන් අතර වන සමාජ සබඳතා දේවල් අතර සම්බන්ධතා ලෙස අත්‍යාවශ්‍යයෙන් ම පෙනී යන්නේ කුමක් නිසා ද යන්න, පැහැදිලි කෙරේ. දෙන ලද ඕනෑ ම වෙලඳ භාන්ඩයක වටිනාකම වූ කලි එය නිෂ්පාදනය කිරීමෙහි දී වැය වූ මිනිස් ශ්‍රමයේ ඓක්‍යයෙහි ස්ඵටිකීකෘත ප්‍රකාශනය බැව්, සංවේදනයේ සංජානනය හා ආසන්න අත්දැකීම්වල පදනම මත කම්කරුවන්ට දැක ගත නොහැකිවාක් මෙන් ම පෙනී යන්නේ ද නැත. වටිනාකම් ආකෘතියේ වෛෂයික සාරය සොයා ගැනීම, විද්‍යාත්මක චින්තනයේ ඓතිහාසික සන්ධිස්ථානයක් නියෝජනය කලේ ය. මෙම සොයා ගැනීම නො වන්නට, පන්ති අරගලයේ වෛෂයික සමාජ-ආර්ථික පදනම් හෝ ඒවායේ විප්ලවවාදී ඇඟවීම් හෝ වටහා ගත නො හැකි වනු ඇත.

තමන් ජීවත් වන පද්ධතියෙහි සමාජ ප්‍රතිවිපාකයන්ට කෙතෙක් අකමැති වුව ද, කම්කරුවා සිටින්නේ, එම පද්ධතියෙහි සම්භවය හෝ එහි අභ්‍යන්තර ප්‍රතිවිරෝධයන් හෝ එහි පැවැත්මේ ඓතිහාසික සීමාසහිත බව, තම ආසන්න අත්දැකීම්වල පදනම මත ග්‍රහනය කර ගත හැකි තත්වයක නො වේ. ධනේශ්වර මාදිලියේ නිෂ්පාදනයේ ප්‍රතිවිරෝධතා ද, ප්‍රාග්ධනය හා වැටුප් ශ්‍රමය අතර පවත්නා සූරා කෑමේ සම්බන්ධතාව ද, පන්ති අරගලයේ නො වැලැක්විය හැකි ස්වභාවය හා එහි විප්ලවවාදී ප්‍රතිවිපාක ද පිලිබඳ අවබෝධය විකසිත වූයේ සැබෑ විද්‍යාත්මක වැඩ කොටසක පදනම මත ය. එම වැඩ කොටස සමග මාක්ස්ගේ නාමය සදාකාලික ව බැඳී පවතිනු ඇත. මෙම විද්‍යාව තුලින් ලබා ගත් දැනුම සහ එම දැනුම අත් කර ගැනීමේ හා විස්තාරනය කිරීමෙහි ලා උපයෝගී වූ විශ්ලේෂන විධික්‍රමය කම්කරු පන්තියට හඳුන්වා දිය යුතු ය. විප්ලවවාදී පක්ෂයේ කර්තව්‍යය වන්නේ එය යි.

ලෙනින් ප්‍රභුවාදියෙකු නම්, විද්‍යාත්මක සත්‍යයේ ධජය යටතේ, බුද්ධි හීනතාවේ නිමක් නැති රූපාකාරයන්ට එරෙහි ව සටන් කල සියල්ලන්ට එම ලේබලය ඇලවිය යුතු ය. මිනිසුන්ගේ සිත් තුල ඇති සකල විධ අඥාන භාවයට හා කෘෘරත්වයට ද සදාකාලික ව එරෙහි වීමට තමා දිවුරා ඇතැයි තෝමස් ජෙෆර්සන් නොලීවේ ද? ප්‍රභුවාදයේ චෝදනාව එල්ල කල යුත්තේ, කම්කරු පන්තියේ දේශපාලන හා සංස්කෘතික බුද්ධි ප්‍රබෝධයට අවමන් කරමින් හා ඊට එරෙහි වෙමින්, එමගින් එම පන්තිය එහි සූරා කන්නන්ගේ අනුකම්පාවට අත් හැර දමන්නවුන්ට ය.

අවසාන වසයෙන් ධනේශ්වර සමාජය තුල කම්කරු පන්ති විඥ්ඥානයේ ස්වයං සිද්ධ ව ජනනය වන ආකෘතීන්ට එරෙහි ව අරගලයක් කිරීමේ අත්‍යවශ්‍යතාව පිලිබඳ ලෙනින්ගේ අවධාරනය ද, ග්‍රාම්‍ය මහජන මතය කෙරේ ඔහුගේ සතුරු භාවය ද ගැන කෙරෙන චෝදනා පිලිබඳ ව සලකා බලමු. ඒවා හැඩ ගැස්වෙන්නේ ජන මාධ්‍යයන්හි ප්‍රචාරක අංශවලින් එල්ල කෙරෙන බෝම්බ ප්‍රහාර හමුවේ වන අතර ලෙනින්ගේ ඉහත ආස්ථානයන් 'ප්‍රජාතන්ත්‍ර-විරෝධී' පමනක් නො ව 'ඒකාධිපතිවාදී' යැයි පවා කෙරෙන චෝදනාවක ස්වරූපය අත්පත් කොට ගෙන ඇත. මෙම චෝදනාවන්ට යටින් පවතින්නේ, කම්කරු පන්තියේ සැබෑ දේශපාලනික හා ඓතිහාසික අවශ්‍යතාවන් ප්‍රකාශයට පත් කල හැකි වන පරිදි වෙනස්, ධනේශ්වර නොවන ආකාරයක මහජන මතයක් නිර්මානය කිරීමෙහි ලා සමාජවාදී ව්‍යාපාරය විසින් දැරූනු ප්‍රයත්නය මගින් අවුලුවන ලද්දා වූ ද, පන්ති අවශ්‍යතා හා සමාජ අගතීන් තුල ගැඹුරට කිඳා බැස ඇත්තා වූ ද, දරාගත නොහෙන සමාජ දොම්නසක එක් ආකාරයකි.

මාක්ස්වාදී ව්‍යාපාරයේ ප්‍රයත්නයන් තුලින් ප්‍රකට වූ, කම්කරු පන්තියේ පන්ති විඥ්ඥානය ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතියට වඩා ගැඹුරු, ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපෘතියක් තවත් නැත. ලෙනින්ගේ විද්‍යාත්මක ව පාදක වූ වැඩ පිලිවෙල ඔහු කම්කරු පන්තිය මත 'පැටවූයේ' නැත. ඒ වෙනුවට, 1917 සිදුවීම්වලට පෙරාතු ව සියවස් කාලකට වැඩි කාලයක් තුල ඔහුගේ සියලු

දේශපාලන වැඩ කටයුතු යොමු වූයේ, රුසියානු කම්කරු පන්තියේ වැඩි දියුනු කොටස්වල සමාජ චින්තනය, විද්‍යාවේ මට්ටමට ඉහල නැංවීමට ය. මෙම කටයුත්තෙහි දී ඔහු ද, බොල්ශෙවික් පක්ෂය ද සාර්ථක වූයේ ය. ජෝන් රීඩ් සටහන් කල පරිදි, මෙම අරමුන ජය ගැනීමෙහි දී ලෙනින්, "අමුතු ආකාරයක ජනප්‍රිය නායකයෙක් -- තනිකර ම බුද්ධියේ මහිමය මත පදනම් වූ නායකයෙක්... දුරවබෝධ ගැඹුරු අදහස් සරල යෙදුම්වලින් පැහැදිලි කිරීමේත් නිශ්චිත තත්වයන් විශ්ලේෂනය කිරීමේත් ශක්තිය ඇති විශිෂ්ටතම බුද්ධිමය සාහසිකත්වය සමග සංකලනය වූ විචක්ෂන භාවයෙන් යුත් -- නායකයෙක්" නියෝජනය කලේ ය. [26]

සමාජවාදී විඥ්ඥානය කම්කරු පන්තිය තුලට ගෙන ඒමේ අවශ්‍යතාව මුලින් ම ප්‍රකාශයට පත් කලේ ලෙනින් නො වේ. 'ස්වයං සිද්ධ සාධකය' ඔජ වැඩවීම පිලිබඳ ව ආර්ථිකවාදීන් ඔහුගේ හෙලා දැකීමට ලක් වීමේ දී ඔහුගේ දැනුම නිසැක ව ම පෝෂනය වූයේ, මාක්ස්ගේ ප්‍රාග්ධනය ගැඹුරින් හැදෑරීමෙන් හා ධනවාදය, මිනිසුන් අතර තහවුරු වූ නිෂ්පාදන සම්බන්ධතාවන්ගේ පද්ධතියක් ලෙස, සූරා කෑමේ සැබෑ සමාජ-මූලක යන්ත්‍රනයන් සඟවා ලන ආකාරය අවබෝධ කොට ගැනීමෙනි. දේශපාලන චින්තකයෙකු ලෙස ලෙනින්ගේ නව්‍යතාව ප්‍රකාශයට පත් වන්නේ, කම්කරු පන්තිය තුලට සවිඥ්ඥානකත්වය හඳුන්වා දීමේ අවශ්‍යතාව පිලිබඳ ඔහුගේ අවධාරනයෙන් නො වේ -- එය එසේ යැයි යුරෝපය පුරා මාක්ස්වාදීහු පිලිගෙන සිටියහ -- එහෙත් එම නව්‍යතාව ප්‍රකට වනුයේ මෙම නියාමය ව්‍යවහාරයට නැගීමේ දී ඔහු දැක්වූ තිරසර බව හා නොසැලෙනසුලු බවත්, ඔහු එයින් උපුටා ගත් දුරදිග යන දේශපාලන හා සංවිධානාත්මක නිගමනත් නිසා ය.

## පන්ති විඥානය හා "දේශපාලනික හෙලිදරව් කිරීම්"

එසේ නම්, කම්කරු පන්තියේ දේශපාලන විඥානය වර්ධනය කල යුත්තේ කෙසේ ද? මේ ප්‍රශ්නයට ලෙනින් දී ඇති පිලිතුර වූයේ ප්‍රවේසමෙන් අධ්‍යයනය කල යුතු ය යන්න යි. ආර්ථිකවාදීන්ට නම්, "එදා වේල" පිරිමසා ගැනීම හා බැඳුනු ආර්ථික සටන් සහ කම්හලේ දී මුහුන දෙන තදාසන්න ගැටලු, පන්ති විඥානය වර්ධනයේ ප්‍රධාන මාධ්‍ය විය. එවන් පටු ආර්ථික පදනමක් මත අව්‍යාජ පන්ති විඥානය වර්ධනය කල හැකි ය යන සංකල්පය ලෙනින් සුවිශේෂව ම ප්‍රතික්ෂේප කලේ ය. තදාසන්න ආර්ථික උත්සුකතාවන් සඳහා කෙරෙන අරගල ප්‍රමානවත් වූයේ වෘත්තීය සමිති විඥානයත එනම්, කම්කරු පන්තිය තුල ධනපති විඥානය, වර්ධනය කිරීමට පමනි. විප්ලවවාදී පන්ති විඥානය වර්ධනය වීමට නම්, සමාජවාදීන්, "දේශපාලනික හෙලිදරව් කිරීම්" ලෙස තමා නම් කල දෙය කෙරේ අවධානය යොමු කල යුතුව ඇති බැව් ලෙනින් තරයේ අවධාරනය කලේ ය.

"එබඳු හෙලිදරව් මාධ්‍ය කර ගෙන හැර අන් කවර ක්‍රමයකින් හෝ මහජනයා දේශපාලන දැනුවත් භාවයෙන් හා විප්ලවවාදී ක්‍රියාකාරිත්වයෙන් පුහුනු කල නො හේ. එ බැවින් මේ වර්ගයේ ක්‍රියාකාරිත්වය, සමස්තයක් ලෙස ජාත්‍යන්තර සමාජ ප්‍රජාතන්ත්‍රවාදයේ කටයුතු අතර වඩාත් ම වැදගත් එකකි. දේශපාලන නිදහස කිසි ලෙසකිනිදු හෙලිදරව් කිරීම් බැහැර නො කරයිත එය හුදෙක් ඒවායේ දිශානතියෙහි ක්ෂේත්‍රය යම් තරමකින් වෙනස් කරනු පමනකි." [27]

ඒවායේ අදාලත්වය කිසිදු අයුරකින් හෝ නොනැසුනු හෝ අප ජීවත් වන කාල පරිච්ඡේදය තුල සමාජවාදී විඥානයේ ස්වභාවය හා වැදගත්කමෙහි තියුනු කඩා වැටීම හේතු කොට ගෙන නොඅඩු වැදගත්කමකින් යුත් -- වචනවලින් ලෙනින් මෙසේ ලිවී යඃ

"කෲර පාලනයේ, මර්දනයේ, හිෂනයේ හා අපවාදයේ **සියලු** අවස්ථාවන්ට, එය කවර පන්තිය කෙරේ බලපාන්නේ ද යන්න නො තකා ප්‍රතිචාර දැක්වීමට කම්කරුවන් පුහුනු කල හොත් විනාත ඊට ද වඩා, වෙනත් කිසිවකින් නො ව සමාජ ප්‍රජාතන්ත්‍රවාදී (එනම් - විප්ලවවාදී) දෘෂ්ටි කෝනයකින් ප්‍රතිචාර දැක්වීමට ඔවුන් පුහුනු කල හොත් විනාත කම්කරු පන්තියේ විඥානයට අව්‍යාජ පන්ති විඥානය බවට පත් විය නො හේ. සංයුක්ත හා සියල්ලට මත් වඩා ස්ථානගත, දේශපාලන කරුනු හා සිද්ධීන් තුලින්, අනෙක් **සෑම** සමාජ පන්තියක ම, එහි බුද්ධිමය සදාචාරාත්මක හා දේශපාලනික ජීවිතය ප්‍රකට වන **සෑම** විටෙක දී ම නිරීක්ෂනය කිරීමට කම්කරුවන් උගත හොත් විනාත ජනගහනයේ **සියලු** පන්තීන්හි ස්තරයන්හි හා කන්ඩායම්වල, ජීවිතයේ හා ක්‍රියාකාරිත්වයේ **සියලු** පැතිකඩ සම්බන්ධයෙන් වන භෞතිකවාදී තක්සේරුව ව්‍යවහාරයට නැගීමට ඔවුන් උගත හොත් විනාත කම්කරු පන්ති විඥානයට අව්‍යාජ පන්ති විඥානය බවට පත් විය නො හැකි ය. කම්කරු පන්තියේ අවධානය, නිරීක්ෂනය හා විඥානය සුවිශේෂ ව ම නැත හොත් ප්‍රධාන වසයෙන් වුව තමා (කම්කරු පන්තිය-පරි.) කෙරෙහි ම පමනක් යොමු කරවන්නා වූ යමෙක් වේ ද, ඔවුහු සමාජ ප්‍රජාතන්ත්‍රවාදියෝ නො වෙති. මක් නිසා ද යත්, කම්කරු පන්තියේ ස්වයං දැනුම, නූතන සමාජයේ සියලු වර්ගවල පන්ති අතර සම්බන්ධතාවන් පිලිබඳව, සිය දේශපාලන ජීවිතයේ අත්දැකීම් තුලින් අත්පත් කොට ගත් තනිකර ම සුපැහැදිලි න්‍යායික වැටහීමක් සමග නො වෙන් කල හැකි පරිද්දෙන් බැඳී නොපවතින නිසා ය. - ප්‍රායෝගික වැටහීම තරමට ම සරිලන න්‍යායික අවබෝධයක් සමග බැඳී නොපවතින බැව් පැවසීම වුව වඩා නිවැරදි විය හැකි ය. - මේ හේතුව නිසා, 'ආර්ථික අරගලයේ සංකල්පය මහජනයා දේශපාලන ව්‍යාපාරයට ඇද ගැනීමේ වඩාත් පුලුල්ව භාවිත කල හැකි මාධ්‍ය වෙතැ' යි අපේ ආර්ථිකවාදීන් දේශනා කරන අදහස අතිශය හානිදායක වන අතර, එහි ප්‍රායෝගික අර්ථභාරයෙන් ප්‍රතිගාමී වේ."[28]

කම්කරුවන්ගේ අවධානය ආකර්ෂනය කර ගැනීමේ සහ ඔවුන්ගේ සහාය දිනා ගැනීමේ ඉක්මන් ම හා පහසු ම මග, ආර්ථික හා 'වැඩ බිමේ' ගැටලු පිලිබඳව යොමු වීම බව -- සහ සමාජවාදීන් ප්‍රධාන වසයෙන් කටයුතු කල යුත්තේ

කම්කරුවන්ගේ දෛනික ආර්ථික අරගලය තුල බව ද - තිර කොට පැවසූ සංශෝධනවාදීන්, සැබවින් ම ස්වයං සිද්ධ කම්කරු ව්‍යාපාරයේ සමාජවාදී විඥානයෙහි වර්ධනය පිනිස කිසිදු වැදගත් දායකත්වයක් ලබා නොදෙන බව ලෙනින් තරයේ පැවසී ය. ඇත්ත වසයෙන් ම, ඔවුන් කටයුතු කරමින් සිටියේ විප්ලවවාදී සමාජවාදීන් ලෙස නො ව, හුදු වෘත්තීය සමිතිකරුවන් ලෙස ය. සමාජවාදීන්ගේ සැබෑ අත්‍යවශ්‍ය කර්තව්‍යය වූයේ කම්කරුවන්ට, ඔවුන් ඒ වන විටත් දැන සිටි දේ ගැන -- කම්හලේ දෛනික හා රැකියා ප්‍රශ්න ගැන -- කථා කිරීම නො ව, ඔවුන්ගේ සමීප ආර්ථික අත්දැකීම්වලින් ග්‍රහනය නො කල හැකි දේශපාලන ඥානය සම්බන්ධව කතා කිරීම යි.

"බුද්ධිමතුන් වන ඔබට මෙම ඥානය ලබා ගත හැකි ය" යි, කම්කරුවෙකුට සමීප හඬින් ලෙනින් කියයි. "මෙතෙක් ඔබ අප වෙත ගෙන ආ පමන මෙන් සියදහස් ගුනයෙන් එසේ ලබා ගත් දෙය අප වෙත ගෙන ඒම ඔබේ කාර්යය යි. ඔබ විසින් එය අප වෙත ගෙන ආ යුත්තේ සාකච්ඡා, පත්‍රිකා සහ ලිපි (අපගේ අවංක භාවය පිලිබඳව කමන්න -- ඒවා බොහෝ විට නීරස ය) මාර්ගයෙන් පමනක් නො වේ. නිශ්චිතව කිව හොත් අපේ ආන්ඩුව ද අපේ පාලක පන්තීන් ද ජීවිතයේ සියලු අංශ තුල හරියට ම මේ මොහොතේ දී කුමක් කරමින් සිටිත් ද යන්න පිලිබඳව කෙරෙන විචිත්‍ර හෙලිදරව්වල මාර්ගයෙන් ද එම ඥානය ගෙන ආ යුතු ය.''[29]

කම්කරු පන්තියේ ආර්ථික අරගලවලින් ඉවත් ව හිඳීම කෙසේ වුවත්, ඒවා කෙරේ මන්දෝත්සාහී වීම හෝ සැබැවින්ම ලෙනින්ගේ උපදේශය නො වී ය. ඔහු විරුද්ධ වූයේ සමාජවාදීන් අසාධාරන හා අන්තරායකාරී ලෙස එවන් අරගලවලට කොටු වීමට යත සිය උද්ඝෝෂන හා ප්‍රායෝගික වැඩ කටයුතු, ආර්ථික ඉල්ලීම් හා වෘත්තීය සමිති අරගලවලට සීමා කර ගැනීමේ ඔවුන්ගේ ප්‍රවනතාවට යත සමාජය තුල විප්ලවවාදී බලවේගය ලෙස කම්කරු පන්තිය මුහුන දෙන තීරනාත්මක හා මූලික දේශපාලන කරුනු නො තකා හා මග හැර ගෙන සිටීමට ය. තව ද, සමාජවාදීන් වෘත්තීය සමිති අරගලයන්ට මැදිහත් වූ කල්හි, ඔවුන්ගේ සැබෑ වගකීම වූයේ "ආර්ථික අරගලය විසින් කම්කරුවන් අතර ජනනය කෙරුනු දේශපාලන සවිඥානක භාවයේ ගිනි පුලිඟු, කම්කරුවන් **සමාජ ප්‍රජාතන්ත්‍රවාදී** දේශපාලන විඥානයේ මට්ටමට **ඔසවා ලීමේ** අභිප්‍රාය වෙනුවෙන් **භාවිත කිරීම**" [30] බැව් ලෙනින් ලිවී ය.

*'කල යුත්තේ කුමක් ද?'* කෘතිය පිලිබඳ මෙම විචාරයට මා විසින් මේ සා විශාල කාලයක් කැප කිරීමට හේතුව ඔබ හැමට ද පැහැදිලි වේ යැයි මම බලාපොරොත්තු වෙමි. අප විසින් සැබවින් ම කතා කරමින් සිටියේ, ලෝක සමාජවාදී වෙබ් අඩවියෙහි ම න්‍යායය හා ඉදිරි දර්ශනය පිලිබඳව වීම එම හේතුව යි.

**සටහන් :**


[1] *"Left wing" Communism, An Infantile disorder"* (වාමාංශික කොමියුනිස්ට්වාදය ලදරු වලිප්පුවකි) නිව් යෝර්ක් ඉන්ටර්නැෂනල් පබ්ලිෂර්ස්-1969 - පිටු, 11)

[2] *London: New Park,* 1980 (ලන්ඩන් නිව් පාර්ක් 1980) පිටු, 53-54.

[3] *Selected Philosophical Works* (තෝරාගත් දර්ශනවාදී කෘති) 1 වැනි වෙලුම, මොස්කව් ප්‍රෝග්‍රස් පබ්ලිෂර්ස් 1976. පිටු 76-80.

[4] *Collected Works* (එකතු කල කෘතීන්) 4 වෙලුම, මොස්කව් ප්‍රෝග්‍රස් පබ්ලිෂර්ස් 1964. පිටු, 398.

[5] *Marxcism in Russia, Key documents* (රුසියාවේ මාක්ස්වාදය ප්‍රධාන ලියවිලි) 1879-1906. නීල් හාර්ඩිං සංස්කරනය - කේම්බ්‍රිජ් 1983. පිටු 251.

[6] -එම- පිටු 252

[7] -එම- පිටු 369-70

[8] *ලෙනින්, තෝරාගත් කෘති වෙලුම් දොලහ*, 1 වෙලුම, ( මොස්කව්, ප්‍රගති ප්‍රකාශක මන්දිරය 1979), පි. 117-18.

[9] -එම- පිටු 135-36.

[10] -එම- පි. 136.

[11] -එම- පිටු 137-38.

[12] -එම- පිටු 138.

[13] -එම- පිටු 143.

[14] -එම- පිටු 152-53.

[15] -එම- පිටු 153-54.

[16] (ලන්ඩන් ස්ටයිනි පබ්ලිකේෂන්ස්) 1995 පිටු 17.

[17] (ලන්ඩන් යුනිවසිටි ප්‍රෙස්) 1978. පිටු 389-90.

[18] -එම- පිටු 390.

[19] *Collected Works,* (එකතු කල කෘති 4 වෙලුම) නිව් යෝර්ක් ඉන්ටර්නැෂනල් පබ්ලිෂර්ස්, 1975-පිටු......

[20] *Leninism* (ලෙනින්වාදය) ඩර්හැම් එන්. සී. ඩියුක් යුනිවර්සිටි ප්‍රෙස් 1996 පිටු-34.

[21] -එම- පිටු 173

[22] -එම- 174

[23] -එම- පිටු-172

[24] *Collected Works* (එකතු කල කෘති 14 වෙලුම ප්‍රෝග්‍රස් පබ්ලිෂර්ස් 1977 පිටු 323 (අවධාරනය මුල් කෘතියේ)

[25] -එම- පිටු 325 අවධාරනය මුල් කෘතියේ

[26] *Ten Days That Shook the World* – ලොව සෙල වූ දස දවස-පෙන්ගුයින් 1977-පිටු 128

[27] *Collected Works* (එකතු කල කෘති 5 වෙලුම පිටු 412 අවධාරනය මුල් කෘතියේ

[28] -එම- පිටු 412-413 අවධාරනය මුල් කෘතියේ.

[29] -එම- පිටු 417 - අවධාරනය මුල් කෘතියේ.

[30] -එම- පිටු 416 අවධාරනය මුල් කෘතියේ.


© www.wsws.org